**පුවත්පත**
**නිවසටම ගෙන්වා ගැනීමට**
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න


# අරුණ


2023 ජුලි 14 සිකුරාදා | හතර වැනි කාණ්ඩය | 244 කලාපය | මිල රු 60.00 | www.aruna.lk


## පානදුර රෝහලේදී කැනියුලාව විෂ වී සෞඛ්‍ය සේවකයා මරුට



■ බිමල් ජයසිංහ- බණ්ඩාරගම

උණ රෝගයට ප්‍රතිකාර ගැනීමට පානදුර රෝහලට ඇතුළත් කළ රෝගියකුට සවිකළ කැනියුලාව ආසාදනය වීමෙන් ඊයේ (13වැනිදා) එම රෝගියා මියගොස් ඇතැයි රෝහල් ආරංචි මාර්ග පවසයි. මෙසේ මියගොස් ඇත්තේ ඖෂධ නියාමන අධිකාරියේ කළමනාකාරණ සහකාරවරයකි.

## කුඩ්ඩෝ කෝටි 28ක ඇණ මුරිච්චි ගලවලා



# නව කැලණි පාලම අනතුරේ

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

ජපන් රජයේ ණය ආධාර මත අලුතින් ඉදිකරන ලද කලයාණි රන් පිවිසුම (Golden Gate Kalyani) නමින් නම් කළ නව කැලණි පාලම අනතුරකට හෙළමින් මත්කුඩුවලට ඇබ්බැහිවූවන් රුපියල් කෝටි 28කට අධික වටිනාකමකින් යුත් තඹ කම්බි හා ඇණ මුරුච්චි ගලවාගෙන ගොස් ඇතැයි අනාවරණය වී ඇත.

▸▸ 02 පිටුවට

## 2024 පළමු ශ්‍රේණියට

## විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ටත් අයැදුම් කරන්න අවස්ථාව

ලබන වසරේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍ර ලේඛය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඊයේ (13 වැනිදා) නිකුත් කරන ලදී. චක්‍රලේඛයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරාලන විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ටද අයැදුම් කිරීමට මෙවර විධිවිධාන සලසා තිබේ.

▸▸ 02 පිටුවට

## සිසුවියගේ නිරුවත මිතුරන් අතරේ බෙදූ පාසල් පෙම්වතා අල්ලයි

තවත් සිසුන් 5ක් සමග උසාවියට

■ ඉෂාර රත්නකාර

පාසල් සිසුවියකගේ නිරුවත් වීඩියෝ දර්ශන අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය කරන ලදැයි කුරුණෑගල ප්‍රධාන පෙළේ පාසල්වල සිසුන් 06 දෙනකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සැකපිට අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට ඊයේ (13 වැනිදා) ඉදිරිපත් කර තිබිණි.

▸▸ 02 පිටුවට

## විනය කඩන හිමිවරුන් ගැන පියවර ගැනීමේ වගකීම ඇත්තේ ප්‍රාදේශීය නාහිමිවරුන්ට

නියංගොඩ විජිතසිරි මල්වතු අනුනාහිමි



■ දීපා වසන්ති එදිරිසිංහ

යම් භික්ෂුවක් විනය කඩකර ඇත්නම් ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමේ වගකීම ඒ ඒ ප්‍රාදේශීය නායක හිමිවරුන්ට පැවරී ඇතැයි මල්වතු පාර්ශ්වයේ අනුනායක, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලයේ කුලපති, නියංගොඩ විජිතසිරි හිමියෝ පැවසූහ.

▸▸ 02 පිටුවට

## රා බද්දක්

■ නිලන්ත මදුරාවල

රා ලීටරයකට රුපියල් දහයක සුරා බද්දක් පැනවීමට රාජ්‍ය නව ආදායම් මාර්ග උත්පාදනය සඳහා උපාය මාර්ග සෙවීමට පත් කළ කමිටුව යෝජනා කර තිබේ. මෙම බද්ද පැනවීම මගින් රජයට රුපියල් දශ ලක්ෂ එකසිය පනස් හයක ආදායමක් අපේක්ෂා කෙරේ. රා මත බද්දක් පැනවීමට යෝජනා කළ ප්‍රථම අවස්ථාව මෙය වෙයි.

▸▸ 02 පිටුවට

## ඌරුබොක්ක පොලිසියේ දඩ පොතක්ම මිසිං

තිබ්බෙ පී.සී. නෝනා ළඟ

■ එෆ්.අස්ලම්

මාතර ඌරුබොක්ක පොලිසියේ රථවාහන අංශයේ තිබූ රථවාහන දඩපත්‍රිකා පනහක පොතක් අතුරුදන්වී තිබේ. ඌරුබොක්ක පොලිසියේ රථවාහන අංශයට අනුයුක්ත පොලිස් කොස්තාපල්වරියක භාරයේ තිබූ මෙම දඩ පත්‍රිකා 50 ක් සහිත පොතම මෙලෙස අතුරුදන්වී ඇත.

▸▸ 02 පිටුවට

## දේශපාලන මැරයෝ බසයක් පැහැරගෙන ගිනි තබන්න හදලා

■ එෆ්.අස්ලම්

මධ්‍යම පළාත් මාර්ගස්ත මගී ප්‍රවාහන අධිකාරියේ අවසරය මත ධාවනය වූ බස් රථයක් ධාවනයෙන් ඉවත් කරගන්නා ලෙසට මරණීය තර්ජන සිදුකර එම බස් රථය පැහැරගෙන ගොස් ගිනි තැබීමට උත්සහා දැරූ දේශපාලන හිතවතකුගේ මැරයන් අට දෙනකු සොයා විල්ගමුව පොලිසිය පරීක්ෂණ ආරම්භ කර තිබේ.

▸▸ 02 පිටුවට

## කේතය නැතිව තෙල් නොදුන්නැයි බේකරි ගෝලයෝ බේරුවල ෂෙඩ් එකක් කුඩු කරති

■ එෆ්.අස්ලම්

බේරුවල නගරයේ ඉන්ධන පිරවුම්හලකට බීමතින් කඩා වැදී එහි සේවකයන්ට සහ දේපළ වලට පහරදී බරපතළ හානි කළ මැරයන් පස් දෙනෙකු බේරුවල පොලිසිය විසින් ඊයේ (13 වැනිදා) උදැසන අත්අඩංගුවට ගෙන තිබේ.

▸▸ 02 පිටුවට

## නීතිවේදිනියගේ නිවසින් මත්පැන් බෝතල් 15ක් උස්සලා

■ දීපා වසන්ති එදිරිසිංහ

තම නිවසේ අල්මාරියක තිබූ විදේශීය මත්පැන් බෝතල් 15ක්, රන් භාණ්ඩ හා ලැප්ටොප් පරිගණකයක් සොරාගෙන ගොස් ඇතැයි නීතිවේදිනියක විසින් තලංගම පොලිසියට පැමිණිලි කර ඇත. මෙම නීතිවේදිනිය පදිංචි බත්තරමුල්ල බටපොත පිහිටි නිවසේදී මෙම සොරකම ඉකුත් 12 වැනිද සිදුව තිබේ.

▸▸ 02 පිටුවට




## රෝයල් පාර්ක් සිද්ධියේ ජූඩ්ට සමාව දෙන්න පටන් ගත්තේ මහින්දගේ කාලේ

මෛත්‍රී උසාවියට දැනුම්දෙයි



■ කේ.එස්. උදයකුමාර

රෝයල් පාර්ක් මිනීමැරුම් නඩුවේ මරණීය දණ්ඩනය නියම වී සිටි ජූඩ් ශ්‍රමන්ත ජයමහ නමැති වින්තිකරුට සමාව ප්‍රදානය කිරීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කර තිබෙන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පාලන සමයේ බවත් තමා විසින් අදාළ නිදහස පිරිනමන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව බවත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (13 වැනිද) දැනුම් දුන්නේය.

▸▸ 02 පිටුවට

## ප්‍රශ්න තිබුණ කියල බුද්ධිමතුන් රට හැර යාම විසඳුමක් නොවේ

විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති

■ දිනේෂ් රූපසිංහ - පිළියන්දල

▸▸ 02 පිටුවට

## විනයාරක්ෂක සෙබළා ළඟ කුඩු

■ දීපා වසන්ති එදිරිසිංහ

▸▸ 02 පිටුවට

01 වැනි පිටුවෙන්...

## 2024 පළමු ශ්‍රේණියට..

මෙලෙස ඇයැදුම් කරන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සාමාන්‍ය දරුවන් සමග අධ්‍යාපනය ලැබීමට සුදුසු බවට අදළ කලාප අධ්‍යාපන කාර්යාල මගින් තහවුරු කළ යුතු බව චක්‍රලේඛයේ සඳහන්ව ඇත.

අයැදුම් කළ හැකි අවසන් දිනය අගෝස්තු මස 18 වැනිද වෙයි.

පාසලේ අධ්‍යාපනය ලබන සිසුසිසුවියන්ගේ සහෝදර සහෝදරියන්ගේ ගණය වෙනුවෙන් වෙන් කෙරෙන සියයට පහළොවක ප්‍රතිශතය පසුගිය වසරේ සිට සියයට දහතරක් දක්වා අඩු කර, සියයට පහක්ව පැවති අධ්‍යාපන අමාත්‍යාංශය සහ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්ගේ ගණයේ ප්‍රතිශතය සියයට හය දක්වා වැඩි කරන ලද අතර මෙවරද එම ප්‍රතිශත එම ආකාරයෙන්ම පවතී.

## සිසුවියගේ නිරුවත..

තම දියණියගේ නිරුවත් වීඩියෝ දර්ශන අන්තර්ජාලය ඔස්සේ ප්‍රචාරය කර ඇති බවට ව්‍යාපාරිකයකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව සැකකාර සිසුන් අත්අඩංගුවට ගෙන කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කර තිබිණි.

මෙම සිද්ධියේ පළමු සැකකරු පැමිණිලිකරුගේ දියණිය සමග පෙම් සබඳතාවයක් පවත්වා ඇති බවත් එහි දී දෙදෙනාගේ හැසිරීමේ දී සිසුවියගේ කැමැත්තෙන් ලබා ගත් නිරුවත් වීඩියෝ දර්ශන සැකකරුගේ ඇපල් ජංගම දුරකතනයේ ගබඩා කර තිබී ඇති බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට දන්වා සිටියේය.

මෙම සිද්ධියේ 06 වැනි සැකකාර සිසුවාගේ වරකාපොළ ප්‍රදේශයේ පිහිටි නිවසේ දී උපන් දින සාදයක් පවත්වා ඇතැයි දන්වා සිටි පොලිසිය එහිදී එම සිසුන් මත්පැන් ද පානය කර ඇතැයි දන්වා සිටියේය.

එම අවස්ථාව වන විට පළමු වන සැකකාර සිසුවා සිය පෙම්වතිය සමග අමනාපයෙන් සිට ඇති අතර ඒ අනුව සිසුවියගේ නිරුවත් වීඩියෝ දර්ශන අන්තර්ජාලය ඔස්සේ සිය මිතුරන් අතරේ බෙදාහැර ගෙන තිබේ.

අනතුරුව සැකකාර සිසුන් අදළ නිරුවත් වීඩියෝ දර්ශන අන්ත ර්ජාලය ඔස්සේ ප්‍රචාරය කර ඇතැයි අධිකරණයට දන්වා සිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අත්අඩංගුවට ගත් සිසුන් කුරුණෑගල ප්‍රධාන පෙළේ පාසල්වල උසස් පෙළ හදරන සිසුන් බවද දන්වා සිටියේය. මෙම සිසුන් සියලු දෙනා සමාජයේ කැපී පෙනෙන පවුල්වල දරුවන් බවට හෙළි වී ඇත.

අදළ සැකකාර සිසුන් 06 දෙනා එක් අයකුට රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුද හරින ලෙස අධිකරණය නියෝග කළේය.

## නීතිවේදිනියගේ නිවසින් ..

ඇය එම අවස්ථාවේ නිවසේ සිට නැති අතර ජනේලයකින් ඇතුළු වූ සොරුන් මත්පැන් බෝතල් ඇතුළු භාණ්ඩ සොරාගෙන ගොස් ඇතැයි සඳහන් වේ. මත්පැන් බෝතල ඇතුළු සොරාගෙන ගිය භාණ්ඩවල වටිනාකම ඇය විසින් සඳහන් කොට නැත.

මෙතෙක් මේ සොරකම සම්බන්ධයෙන් කිසිවකු අත්අඩංගුවට ගෙන නොමැති අතර ඒ පිළිබඳ ඉදිරි විමර්ශන තලංගම පොලිසිය මගින් සිදු කෙරේ.

## දේශපාලන මැරයෝ..

මෙම මැරයන් හෙට්ටිපොළ නගරයේදී රිය සහායක සහ රියැදුරුට පහරදී බස් රථය පැහැරගැනීමට උත්සහා දරා ඇති බවත් බසයේ මගීන්ගේ මැදිහත් වීම මත එම උත්සහාය ව්‍යාර්ථ වී ඇති බවත් පැමිණිල්ලේ සඳහන් ය.

මැරයන් මෙය සිදුකර ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුගේ හිතවතකුගේ බස් රථයක් වෙනුවෙන් බවද පැමිණිලිකාර පාර්ශ්වය පොලිසිය හමුවේ සඳහන් කර තිබේ.

හෙට්ටිපොළ නගරයේදී මෙය සිදුවී ඇති අතර තර්ජනය කළ මැරයන් ඕනෑම පොලිසියකට ගොස් තමන්ට එරෙහිව පැමිණිලි කර පුළුවන් දෙයක් කර පෙන්වපං යැයිද සඳහන් කර තිබේ.

මෙලෙස පැමිණිලි කර ඇත්තේ හෙට්ටිපොළ ප්‍රදේශයේ පදිංචි බස් හිමිකරුවකු සහ එහි කොන්දෙස්තරවරයා ය.

පැමිණිලිකාර පාර්ශ්වයේ බස් රථයක් වසර 17 ක කාලයක් මධ්‍යම පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ අවසරය මත හෙට්ටිපොළ සිට දඹුල්ල දක්වා දෛනිකව ගමන් වාර හතරක් ධාවනය කර තිබේ. නමුත් පසුගිය කොවිඩ් සමයේ මගී අපහසුතාව සැලකිල්ලට ගෙන ඔවුන්ගේ ගමන්වාර හතරෙන් උදෑසන සහ සවස ගමන්වාර දෙක හෙට්ටිපොළ හසලක හරහා මහියංගණයට සහ මහියංගණය හසලක හෙට්ටිපොළ දක්වා ධාවනය කරවා ඇත.

එසේ තිබියෙදී මධ්‍යම පළාතේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුගේ හිතවතකුට අයත් බස් රථයකට මහියංගණය සිට දඹුල්ල දක්වා ධාවනය කිරීමට මාර්ග බලපත්‍රයක් ලබාදී ඇත්තේ ඉහත කී බස් රථයේ ධාවන කාලයට සමානවමය.

මේ හේතුවෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියද ඉහළ බලපෑම් මත ධාවන කාල සංශෝධනයක් සිදුකරමින් හෙට්ටිපොළ සිට මහියංගණය දක්වා දීර්ඝ කළ බස් රථයට ගමන්වාර හතරම දීර්ඝ කළ ආකාරයට ධාවනය කරවන ලෙස දැනුම් දී ඇත. නැතහොත් හෙට්ටිපොළ සිට දඹුල්ල දක්වාම ගමන්වාර හතරම ධාවනය කරවන ලෙස දැනුම් දී ඇත.

කෙසේ වෙතත් බස් රථයේ හිමිකරු ඊට එකඟ නොවීම නිසා මහියංගණයේ සිට දඹුල්ල දක්වා නව මාර්ග බලපත්‍රයක් ලබාගත් බස් හිමිකරු ඉහත කී පුද්ගලයාගේ බස් රථය ධාවනයෙන් ඉවත් කරලීමට විවිධ උත්සහායන් ගෙන ඇතැයිද පැමිණිලිකාර පාර්ශ්වය සඳහන් කර තිබේ.


ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board
බදාදා නීලු ප්‍රතිඵල 2023.07.12 www.nlb.lk NLB
මහජන සම්පත
දිනුම් වාරය : 5173
රු. 21,282,344.00
N 0 9 4 2 3 9

3415
රු. 69,031,723.20
A 07 10 22 59

ධන නිධානය
දිනුම් වාරය : 1203
රු. 99,504,868.80
T 17 25 43 63 T

හඳහන
482
රු. 3,213,132.60
18 41 56 59

Mega POWER
1521
Rs.400,795,272.00
රු. 10,000,000.00
C 20 18 36 41 79
රු. 10,000,000.00


# ප්‍රශ්න තිබුණ කියලා බුද්ධිමතුන් රට හැර යාම විසඳුමක් නොවේ



## විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති

■ දිනේෂ් රූපසිංහ - පිළියන්දල

විශ්වවිද්‍යාලවල තරුණ ආචාර්යවරු විදේශ ගතවීමේ යම් ප්‍රවණතාවක් පැවැතියද, 2022 වසරේදී විදේශ ගත වූ ප්‍රමාණයට වඩා මේ වසරේ විදේශ ගත වූ ප්‍රමාණය අඩුවී ඇතැයිද, මේ වෙලාව රටට බුද්ධිය අවශ්‍ය වෙලාවක් බවද පලා යන වෙලාවක් නොවන බව ද විශ්වවිද්‍යාලයීය කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග සඳහන් කළේය.

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය එක්ව නවීකරණය කොට අධිශ්‍රේණිගත තැපැල් කාර්යාලයක් බවට උසස් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප තැපැල් කාර්යාලය ඊයේ (13 වැනිද) විවෘත කිරීමෙන් පසුව මහචාර්යවරයා මේ බව පැවසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මහාචාර්යවරයා,

එක ශිෂ්‍යයෙක්ව එළියට ගේන්න මිලියන ගණනක් වියදම් කරනවා. ඒ අය ඒ තනතුරු අතහැර දමලා විදේශ ගත වෙන්නේ හුදෙක්ම පෞද්ගලික කරුණු කාරණා මත. නමුත් ඔවුන් එය දෙවරක් සිතිය යුතුයි, මේ බුද්ධිමතුන්ගේ අවස්ථාවයි. බුද්ධිමතුන්ට තමයි රට බාර වෙන්නේ. ඒ නිසා බුද්ධිමතුන් අනිවාර්යයෙන් රට තුළ විශ්වවිද්‍යාල තුළ සිටිය යුතු අවස්ථාවක් මේක. දරුවන්ට ප්‍රශ්න තියෙනවා විශ්වවිද්‍යාලවලට ප්‍රශ්න තියෙනවා. නමුත් විසඳුම වෙන්නේ රට අතහැරල දල යෑම නෙමෙයි. මේ වෙලාවේ අපිත් එක්ක අත්වැල් බැඳගෙන, ප්‍රශ්නය අපි බෙදගෙන මේ තත්ත්වයෙන් ගොඩ ඇවිල්ලා හෙට හොඳ දවසක් බවට පත්කළ යුතුයි.

විශ්වවිද්‍යාල තුළ ඉන්නේ අවුරුදු 20ත් 24ත් අතර නව යෞවනයේ සිටින තරුණ තරුණියන්. ඒ නිසා ඔවුන් තනි පුද්ගලයෙක් ලෙස ගත්තහම ඉතා හොඳයි. අපේ කොණ්ඩෙ පැහිලා තියෙන්නෙ විශ්වවිද්‍යාලය ඇතුළෙදීමයි. අපි කවදවත් මේ විශ්වවිද්‍යාල ඇතුළේ ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීල නෑ. අපේ තියෙන වගකීම තමයි මේ තරුණ කණ්ඩායම් එක්ක සාමකාමීව කටයුතු කිරීමයි.

01 වැනි පිටුවෙන්...

## විනය කඩන හිමිවරුන් ගැන ..

ඒ අනුව ප්‍රාදේශීය නායක හිමිවරුන්ට පැවරී ඇති වගකීම ගැන නායක පදවිය පිරිනමන සන්නස් පත්‍රයේම සඳහන් කර ඇතැයිද මල්වතු අනුනාහිමියෝ අවධාරණය කරති.

වෙන කවරදටවත් වඩා අද ශාසනික අභියෝග රැසක් තිබෙන බවත්, වැරදි ප්‍රතිපත්තියේ යෙදෙන භික්ෂූන් නිවැරදි මගට ගත යුතු බවත් උන් වහන්සේ පැවසූහ.

එසේම අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්තිවල යෙදෙන භික්ෂූන් අවැඩවලින් මුද ගැනීමේ වගකීම පැවරෙන්නේද ප්‍රාදේශීය සංඝනායක හිමිවරුන්ට බවද මල්වතු අනුනාහිමියෝ කීහ.

සමාජයේ අප්‍රසන්න බව ඇති කිරීම සඳහා යම් යම් සිදුවීම් මහ පරිමාණයෙන් ප්‍රචාරය කිරීමත් අද දක්නට ඇතැයි ද නියංගොඩ විජිතසිරි අනුනාහිමියෝ පෙන්වා දුන්හ.

නමුත් තමන්ගේ විහාරස්ථාන, දයකකාරකාදීන් ආරක්ෂාකරගෙන ඹුවන්ගේ දෙලොව යහපතට වැඩ සලසන සිල්වත්, ගුණවත් භික්ෂූන් වහන්සේලා ශාසනය තුළ වැඩ සිටින බව කවුරුත් තේරුම් ගත යුතු යැයිද අනුනාහිමියෝ කීහ.

ගුලවිට කටුදෙර ගලපිටගල පුරාණ විහාරය, මාලිගාවත්ත ශ්‍රී නිවාසාරාම බෞද්ධ මධ්‍යස්ථානය යන උභය විහාරාධිපති ශ්‍රී සද්ධර්ම වාගීෂ්වර, සාහිත්‍ය විශාරද, රාජකීය පණ්ඩිත ශාස්ත්‍රවේදී කටුදෙර සුමන හිමියන්ට බෙන්තර වලල්ලාවිට කෝරළයේ ද්විතිය සංඝනායක පදවියේ අක්ත පත්‍ර ප්‍රදනෝත්සවයේදී මල්වතු අනුනාහිමියෝ මෙම අදහස් දැක්වූහ.

අභිනව නාහිමිට ශ්‍රී සන්නස්පත්‍රය පිරිනැමීම සහ අභිනව නාහිමියන් පිළිගැනීමේ පුණ්‍ය මහෝත්සවය ගලපිටගල පුරාණ විහාරස්ථානයේ දී පැවැත්විණි.

ධර්ම කීර්ති ශ්‍රී සිරිනිවාස යන ගෞරව නාමය සහිතව කළුතර දිස්ත්‍රික්කයේ හා බෙන්තර වලල්ලාවිට කෝරළයේ ද්විතීය සංඝනායක පදවියට පත් පූජ්‍ය කටුදෙර සුමන හිමියන් වෙත ශ්‍රී සන්නස් පත්‍රය ප්‍රදනය කරන ලද්දේ පුනරුත්තාපන කොමසාරිස් ජනරාල්, මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි විසිනි. විජිනිපත පිළිගන්වන ලද්දේ මහාධිකරණ විනිසුරු ආචාර්ය නාමල් බණ්ඩාර බලල්ල විසිනි.

මෙම උත්සව අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී සංජීව එදිරිමාන්න, මීගහතැන් පොලිසියේ ස්ථානාධිපති, වලල්ලවිට ප්‍රාදේශීය ලේකම් ජානක පෙරේරා ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ. මෙම උත්සව සභාව මෙහෙවන ලද්දේ සාහිත්‍ය විශාරද බටුවන්ගල රාහුල හිමියන් සහ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ආයතනයේ නිවේදක නිමේෂ් සිල්වා විසිනි.

## රෝයල් පාර්ක් සිද්ධියේ ..

මෙම විත්තිකරුට සමාව ප්‍රදනය කිරීම මීට පෙර සිටි ජනාධිපතිවරු ක්‍රියාකළ ආකාරයටම කටයුතු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තිය යටතේ පැවරී තිබෙන බලතල ප්‍රකාරව සිදු කර ඇති බවත් හිටපු ජනාධිපතිවරයා දැන්වීය.

අදළ විත්තිකරුට ජනාධිපති සමාව ප්‍රදනය කර නිදහස් කිරීමට ගත් තීරණය බලරහිත කිරීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා කාන්තා මාධ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කළ මූලික අයිතිවාසිකම් පෙත්සම ඊයේ (13 වැනිද) යළි විභාගයට ගත් අවස්ථාවේදී හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන තමා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාෆා මාර්ගයෙන් මෙම දැනුම් දීම සිදු කළේය.

මෙම පෙත්සම ඊයේ එස්. තුරෙයිරාජා, යසන්ත කෝදගොඩ සහ ජනක් ද සිල්වා ගෙන් සමන්විත ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල ඉදිරියේ පෙත්සම් විභාගය සිදු කෙරිණි.

එහිදී මෛත්‍රිපාල සිරිසේන වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා අධිකරණය හමුවේ කරුණු දක්වමින් මෙම පෙත්සම්කරුට සමාව ප්‍රදනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පාලන සමයේ සිට බවත් එය එක් රැයකින් ගනු ලැබූ තීරණයක් නොවන බවත් සඳහන් කළේය.

මෙම සමාව ප්‍රදනය කිරීමට පෙර 2016 වසරේ දී මෙම විත්තිකරු ඇතුළු මරණීය දණ්ඩනය නියම වී සිටි පුද්ගලයන් 70 දෙනකුගේ මරණීය දණ්ඩනය ජීවිතාන්තය තෙක් සිර දඬුවම් දක්වා ලිහිල් කෙරුණු බව සඳහන් කළ ජනාධිපති නීතිඥවරයා හිටපු ජනාධිපති සිරිසේන විසින් එම දඬුවම් ලිහිල් කිරීම සිදු කරන ලද්දේ එවක අධිකරණ ඇමැති විජයදස රාජපක්ෂ විසින් පත් කරන ලද කමිටුවක් විසින් සිදුකරන ලද නිර්දේශ අනුව බවත් සඳහන් කළේය.

මෙහිදී ප්‍රශ්නයක් මතු කළ විනිසුරු යසන්ත කෝදගොඩ මෙම සමාව ප්‍රදනය කිරීමේ දී නිසි නීතිමය පටිපාටිය අනුගමනය කර නොමැති බවට චෝදනා නැගෙනවා වේදැයි" විමසා සිටියේය.

ඊට පිළිතුරු දුන් ජනාධිපති නීතිඥවරයා හිටපු ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිසි පටිපාටිය අනුගමනය කරමින් මෙම සමාව ප්‍රදනය කාර්යය ඉටුකර තිබෙන බවත් ඔහු කිසිදු අවස්ථාවක අත්තනෝමතික ලෙස කටයුතු කර නොමැති බවත් අවධාරණය කළේය.

මෙහිදී විනිසුරු තුරෙයිරාජා ප්‍රශ්නයක් යොමු කරමින් ජනාධිපතිවරයාට තම තීරණයට අනුව විත්තිකරුවකුට සමාව ප්‍රදනය කිරීමට නීතිමය හිමිකමක් තිබේ දැයි විමසා සිටියේය. ඊට පිළිතුරු දෙමින් ජනාධිපති නීතිඥවරයා කියා සිටියේ හිටපු ජනාධිපතිවරයා එම විත්තිකරුට සමාව ප්‍රදනය කිරීමේදී සෙසු ආයතනවලින් ලැබුණු නිර්දේශ සැලකිල්ලට ගෙන එම කටයුත්ත ඉටු කළ බවයි. කිසිදු අවස්ථාවක ඔහු තනි තීරණ මත කටයුතු කර අත්තනෝමතික ආකාරයෙන් මෙම සමාව ප්‍රදනය නොකළ බවත් ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙම නඩුකරයේ පෙත්සම්කාර පාර්ශ්වය වෙනුවෙන් ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන පෙනී සිටින අතර නීතිපතිවරයා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් නෙරින් පුල්ලේ පෙනී සිටි.

## ඌරුබොක්ක පොලිසියේ ..

මේ සම්බන්ධයෙන් ඌරුබොක්ක පොලිස් ස්ථානාධිපතිවරයා මාතර දිසාව බාර නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ මාතර කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වෙත කරුණු වාර්තා කර හෝ නොමැත.

මෙම පොත අතුරුදන්වීම පිටුපස පොලිසියේ රථවාහන අංශයේම නිලධාරීන්ගේ සම්බන්ධයක් ඇති බවද පොලිස් ආරංචිමාර්ග සඳහන් කරයි.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අප ඌරුබොක්ක පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් විමසීමට දුරකතන ඇමතුම් ගත්තත් ඊයේ සවස ස්ථානාධිපතිවරයා නිවාඩු ලබා ගොස් ඇතැයි පැවසීම නිසා පොලිසියෙන් මේ පිළිබඳ නිශ්චිත තොරතුරක් නොලැබිණි.

සමාදානයෙන් සැතපේවා!



1942 08 08

2023 07 17

## කේතය නැතිව ..

මොවුන් වැගන් ආර් මෝටර් රථයකින් ඉන්ධන පිරවුම්හලට පැමිණ තිබෙන අතර එහිදී කිව් ආර් කේතය නොමැතිව ඉන්ධන ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

ඊට ඉන්ධන පිරවුම්හල් සේවකයන් විරෝධය පලකිරීම නිසා මොවුන් ඉන්ධන පිරවුම්හලෙහි සේවකයන්ට පහරදී එහි වීදුරු ආදිය ද බිඳ දේපළවලටද අලාභ හානි සිදුකර ඇත.

මේ සම්බන්ධයෙන් ලද පැමිණිල්ලට අනුව බේරුවල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත් පද්මකුමාර, අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ගයාන් ක්‍රිෂාන්ත ඇතුළු නිලධාරීන් විමර්ශන ආරම්භ කළේය.

පහරදීමට පැමිණි සැකකරුවන් ආරක්ෂිත කැමරා දර්ශන ඔස්සේ හඳුනාගත් අතර ඔවුන් බේරුවල නගරයේ ඇති බේකරි හිමිකරුවකුගේ ගෝලයන් පිරිසක් බවටද අනාවරණය විය.

පහරදීමට සම්බන්ධ සැකකරුවන් පහරදීමෙන් පසුව සැඟවී සිට තිබෙන අතර පොලිසිය විසින් ඔවුන්ව ඊයේ අලුයම අත්අඩංගුවට ගෙන තිබුණි.

පහරකෑමට ලක්වූ ඉන්ධන පිරවුම්හල් සේවකයකු බරපතළ තුවාල ලබා නාගොඩ රෝහල වෙත ඇතුළත් කර ඇති අතර අත්අඩංගුවට පත් සැකකරුවන් පස් දෙනා අද අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.

## රා බද්දක් ..

රා නිෂ්පාදනය දිනකට ලීටර් එක් ලක්ෂ පනස් දහසක් පමණ වන අතර ඉන් නීත්‍යානුකූලව නිෂ්පාදනය වන්නේ ලීටර් පනස් දහසක් පමණය. මේ බව අනාවරණය වූයේ මෙම කමිටු යෝජනා සම්බන්ධයෙන් දැනුම් දීම සඳහා මුදල් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ ඊයේ (13 වැනිද) පැවති මාධ්‍ය හමුවේ දී ය. එම මාධ්‍ය හමුවේදී අදහස් දැක්වූ එම කමිටු ප්‍රධානී, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටිය සඳහන් කළේ නීත්‍යානුකූල නොවන රා නිෂ්පාදනය හේතුවෙන් නීත්‍යානුකූල නිෂ්පාදකයන් ද ගැටලුවකට මුහුණ දී සිටින බවත් එහෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට මෙම බද්ද හඳුන්වා දීමට යෝජනා කළ බවත්ය.

# දිනපොත

## පිළිසකර කළ ඕල්කට් ශාලාව ආනන්ද සිසුන්ට පැවරීම අද

කොළඹ ආනන්ද විද්‍යාලයේ පසුගිය කාලයේදී ගරා වැටීමට ලක්ව තිබූ පැරණිතම ගොඩනැගිල්ල වන ඕල්කට් ශාලාව යළි පිළිසකර කර සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා පැවරීමේ උළෙල අද (14 වැනිද ) පෙරවරු 8.30ට හිටපු කථානායක කරු ජයසූරිය සහ ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරල් කමල් ගුණරත්නගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

## මුස්ලිම් තරුණ සංගමයේ සේවාව අගයන්න පන්සලේ උත්සවයක්

ගම්පොළ මුස්ලිම් තරුණ සංගමය පුරා දස වසරක් තුළ සිදු කරන ලද සේවාව අගැයීමේ උලෙළක් ගම්පොළ රත්තුවිය ශ්‍රී බෝධිරාජාරාමයේදී හෙට (15 වැනිද) පැවැත්වේ. අමරපුර අරියවංශ සද්ධම්ම යුක්තික නිකායේ මහනුවර නුවරඑළිය දෙදිසාවේ ප්‍රධාන සංඝනායක කොත්මලේ සුමනරතන තිස්සාභිධාන නාහිමියන්ගේ අනුශාසනා පරිදි මෙය පැවැත්වේ.

## ඉද්දමල් පූජාව හිනිදුම විහාරයේදී

දකුණු ලකෙන් මුළු සිරිලකටම සෙත්පතා සිදුකරනු ලබන ආශිර්වාදත්මක ජාතික ඉද්දමල් පූජාව 19 වැනි වරටත් හිනිදුම ශ්‍රී සාසනෝදයාරාම මහ විහාරයේදී අද (14 වැනිද) දින සවස 6.00 පැවැත්වීමට නියමිතය. සිංහරාජය හා කන්නලිය ආදී වනාන්තරවලින් නෙළා ගන්නා ඉද්දමල් ලක්ෂ ගණනක් පෙරහරින් පැමිණ බුදුන් වහන්සේට පූජා කරමින් මෙම පින්කම සිදු කෙරේ. මෙම පින්කම පැවැත්වෙන්නේ ජාතික ඉද්දමල් පූජාවේ නිර්මාතෘ දෙරණ මාධ්‍ය ජාලයේ ආගමික උපදේශක කඩිහිංගල විනීත හිමියන්ගේ ප්‍රධානත්වයෙනි.

## ජාතික රූපවාහිනියේ ‘ යහළු යෙහෙළි අද

ජාතික රූපවාහිනියේ ‘සිනේ ඡායා’ වැඩසටහන යටතේ අද ( 14 වැනිද) රාත්‍රි 10ට විකාශය කෙරෙන්නේ ආචාර්ය සුමිත්‍රා පීරිස් විසින් අධ්‍යක්ෂණය කරන ලද ‘යහළු යෙහෙළි’ චිත්‍රපටයය. ජනාධිපති සම්මාන ද හිමි වූ මෙම චිත්‍රපටයේ ටෝනි රණසිංහ, සනත් ගුණතිලක සහ ස්වර්ණා මල්ලවාරච්චි ද රංගනයෙන් දයක වෙති. චිත්‍රපට විකාශයට පෙර ප්‍රවීණ විචාරක ගාමිණී වේරගම සහ ප්‍රවීණ නිළි නදීකා ගුණසේකර සහභාගි වන සාහිත්‍ය කතිකාවක් ද වෙයි.

## දම්තිළිණ ශ්‍රී දළදා පූජෝපහාර ඇසළ මහා පෙරහර හෙට

ගණේමුල්ල, දකුණු ගලහිටියාව, දම්තිළිණ විහාරයේ දම්තිළිණ ශ්‍රී දළද පූජෝපහාර ඇසළ මහා පෙරහැර හෙට (15 වැනිද) පැවැත්වේ. පෙරහැර හෙට (15 වැනිද) රාත්‍රී 7 ට පිටත්ව ගණේමුල්ල නගරය ඔස්සේ වීථි සංචාරය කර විහාරස්ථානයට ගෙවැදීමට නියමිතය. දම්තිළිණ විහාරාධිපති ගම්පහ මහ දිසාවේ අලුත්කුරු පරණකුරු දෙකෝරළයේ ප්‍රධාන සංඝ නායක ධර්මකීර්ති ශ්‍රී තල්පිටියේ කෝලිතවංශ හිමියන්ගේ මූලිකත්වයෙන් මෙම පෙරහැර පැවැත්වේ.

## හුරුළුනිකවැවේ සුධම්ම හිමිට ජපානයේ සංඝනායක පදවිය

මහරගම මහාමේඝාරාම, දෙඩම්දෙණිය සුගතානන්ද විහාරය, ඇතුළු භාවනා මධ්‍යස්ථාන කිහිපයක විහාරත්‍රයාධිපති හුරුළුනිකවැවේ සුධම්ම නාහිමියන් වෙත "ශ්‍රී සෝමානන්ද වංශාලංකාර විනයනය විශාරද සද්ධර්ම කීර්ති ශ්‍රී" යන ගෞරව නාම සහිතව ජපානයේ ප්‍රධාන සංඝනායක ධුරය පිළිබඳව අක්ත පත්‍රය පිළිගැන්වීමේ පුණ්‍ය මහෝත්සවය මහරගම ජාතික තරුණ සේවා සභා ශාලාවේදී ජූලි 16 වැනිද සවස 3ට පැවැත්වේ.

## බෞද්ධ පාලි සරසවියේ අන්තර්ජාතික සම්මන්ත්‍රණයක්

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨය මගින් පළමු වරට සංවිධානය කරන පශ්චාද් උපාධි අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන පරේෂණ සඳහා වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය හෝමාගම විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී ලබන 15 වැනිද පෙරවරු 8 සිට පස්වරු 6 දක්වා පැවැත්වේ.

## නව කැලණි පාලම ..

කොන්ක්‍රීට් ආවරණ තුළ තිබූ තඹ කම්බි ගලවා ඇත්තේ කෝන්ක්‍රීට් ආවරණ රාත්‍රි කාලයේ හොර රහසේ කඩා දමමින් බවද අනාවරණය වී තිබේ. දැනට අනාවරණය වී ඇත්තේ රුපියල් මිලියන 286 (කෝටි 28) ක පමණ අලාභයකි.

මීට අමතරව මත් කුඩු බොන පුද්ගලයන් කටුනායක කොළඹ අධිවේගී මාර්ගයේ අධි විදුලි ධාරාවන් සහිත විදුලි රැහැන් පවා කපාගෙන ගොස් ඇතැයිද ඒ හේතුවෙන් අධිවේගී මාර්ගයේ රාත්‍රියට විදුලි පහන් දැල්වීමට නොහැකි තත්ත්වයක් ඇති බවද අනාවරණය වී ඇත. ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය අඟහරුවාද (11 වැනිද) රැස්වූ ජාතික ආරක්ෂක කවුන්සිලයේදී මේ බව අනාවරණය වී ඇත.

මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් ප්‍රියන්ත මායාදුන්න ඇතුළු මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ද මේ සම්බන්ධව සියලු වාර්තා ජාතික ආරක්ෂක කවුන්සිලයට යොමුකර තිබේ.

පොළවේ සිට සම්බන්ධ වන තඹ කේබල් කපාගෙන යාමෙන් නව කැලණි පාලම අනතුරක ඇතැයි තමාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්වූ ජාතික ආරක්ෂාව පිළිබඳව ආංශික කාරක සභාවේදී හෙළි වූ බවත් ඒ අනුව වහාම ආරක්ෂාව තහවුරු කරන්නැයි වගකිවයුතු අංශවලට යොමුකළ බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී රියර් අද්මිරාල් සරත් වීරසේකර අරුණ කළ විමසුමකදී පැවැසීය.

මෙම ප්‍රදේශය අධිආරක්ෂිත කලාපයක් කරන්නැයි ඔහු යෝජනා කර තිබේ. මෙම තත්ත්වය මත නව කැලණි පාලම හා කටුනායක කොළඹ අධිවේගී මාර්ගයේ ආරක්ෂාව සඳහා රක්නා ලංකා සමාගම වෙත පැවරීමට අවධානය යොමුකර ඇත. කටුනායක-කොළඹ අධිවේගී මාර්ගයේ විදුලි රැහැන්වලට අමතරව ආරක්ෂිත දැල් පවා කපාගෙන ගොස් යකඩවලට විකුණා ඇතැයි හෙළිවී තිබේ. කල්‍යාණී රන් පිවිසුම නව කැලණි පාලම හිටපු ජනපති ගෝඨාභය රාජපක්ෂ විසින් 2021 නොවැම්බර් 24 ද විවෘත කර ඇත.

## විනයාරක්ෂක සෙබළා ..

හෙරොයින් මිලිග්‍රෑම් 220ක් සමගින් යුද හමුද විනයාරක්ෂක බළකායේ සෙබළකු අත්අඩංගුවට ගත් බව කිරුළපන පොලිසිය පවසයි.තිස් එක් හැවිරිදි මෙම යුද හමුද සෙබළා පොල්හේන්ගොඩ ශ්‍රී ලංකා පොලිස් හේවා බළකාය අනුයුක්තව සේවය කළ අයකු බව සඳහන්ය. මෙම සෙබළා පෙරේද (12 වැනිද) කිරුළපන නගරයේ සැක කටයුතු අයුරින් රැඳී සිටියදී පොලිසිය විසින් ඔහු අත්අඩංගුවට ගෙන කළ පරීක්ෂාවේ දී ඔහු සන්තකයේ තිබී මෙම හෙරොයින් ප්‍රමාණය සොයාගෙන ඇත.

# සමුගැනීමේ සාදයට ආ
# නිරෝෂන්ට කිණිසි පහර



මිය ගිය නිරෝෂන්

**මෙරටින් වාර්තා වන අපරාධවලින් වැඩි හරියක්ම සිදු වන්නේ බීමත්කම නිසාය. සතුටු සාමිචියේ යෙදෙමින් එකට මත්පැන් පානය කරන එකම පවුලේ සොහොයුරන්,මෙන්ම ගජ මිතුරන්ද මත්පැන් පානය කිරීමෙන් පසු ගහ මරාගෙන සතුරන් බවට පත්වෙති.එවන් ගැටුමක් නිසා පිහි ඇණුමට ලක්ව පුද්ගලයෙකු මිය යාමේ සිද්ධියක් අපට වාර්තා වූයේ මොරගහහේන තලගල ප්‍රදේශයෙනි.**

ප්‍රධාන පෙළේ දේපළ වෙළෙඳ සමාගමක් විසින් මොරගහහේන තලගල ප්‍රදේශයේ ඉඩමක් සංවර්ධනය කරනු ලබන්නේ ස්කේටර් රියැදුරන් ඇතුළු සේවකයින් හය දෙනෙකු සේවයට යොදාගනිමිනි. මේ සේවකයින් හය දෙනාම හොඳම මිතුරන්ය. නිරන්තරයෙන් මත්පැන් පානය කරමින් සින්දු කියමින් විනෝදවීම මොවුන්ගේ සිරිතකි.

වසර හතකට වැඩි කාලයක් මෙම ඉඩමේ සේවය කළ ස්කේටර් රියදුරකු එම රාජකාරියෙන් ඉවත් වූයේ වෙනත් රැකියාවකට යාම සඳහාය. මේ නිසා මිතුරු සේවකයන් ඔහු වෙනුවෙන් සාදයක්ද සූදනම් කර තිබුණි. ඒ පෙරේද (12 වැනිද) සවසය.

සේවයෙන් ඉවත්වී යන මිනුවන්ගොඩ මාබෝදල ඉද්දවත්ත පදිංචි ස්කේටර් රියදුරු නිරෝෂන් චන්දිම (39) මෙම සාදයට සහභාගී වීමට පෙරේද සවස පැමිණියේ සිය නිවෙසේ සිටය. ඔහුව සාදරයෙන් පිළිගත් මිතුරන් මත්පැන් බෝතල් හතර පහක් හිස් කරමින් පැදුරු සාදයක්ද පවත්වා තිබුණි. රාත්‍රී

## යතුරුපැදියෙන් යන්න එපා කියා බෙල්ලෙන් ඇල්ලුවහම මිතුරාට යකා නැගලා

10.00 ට පමණ එම සාදය නිම වීමත් සමග එහි සේවය කරන කුරුණෑගල මැල්සිරිපුර මිතුරකු යතුරුපැදියට නැග තිබුණේ තමන්ට නිවසට යා යුතු බව කියමිනි. මෙහිදී නිරෝෂන් ඔහුගේ ගමන වළක්වන්නට උත්සහ කර තිබුණේ මිතුරා හොඳ හැටි සප්පායම් වී සිටි නිසාය.

අපි අද මෙහේ ඉඳලා උදේට යමු. පොලිසියට අහුවෙන්නත් පුළුවන් යැයි ඔහු මිතුරාහට පවසා තිබුණි. නමුත් ඊට අවනත නොවූ මිතුරා තමන්ට යා යුතුම යැයි කියමින් යතුරුපැදියෙන් පණ ගන්වන්නට උත්සහා කර තිබුණි. එහිදී නිරෝෂන් විසින් මිතුරාගේ බෙල්ලෙන් තදින් අල්ලා 'හිටපං යකෝ' යැයි පැවසීමත් සමග උරණ වූ මිතුරා නිරෝෂන් හට පහරදී තිබුණි. එහිදී දෙදෙනා අතර ගැටුමක් හටගෙන තිබෙන අතර එම අවස්ථාවේදී මිතුරා තම බෑගයේ තිබූ කිණිස්සක් ගෙන නිරෝෂන්ට ඇණ තිබුණි.

මෙම පිහි පහරින් නිරෝෂන් ජීවිතක්ෂයට පත්වූ අතර ඔහු එක්දරු පියෙකි.

මේ සම්බන්ධයෙන් ලද තොරතුරකට අනුව විමර්ශන ආරම්භ කළ මොරගහහේන පොලිසියට කරුණු රැසක් අනාවරණය කර ගැනීමට හැකිවිය. නිරෝෂන්ගේ මළ සිරුර වෙන්දේසි ඉඩමේ කාර්යාලය අසලට රැගෙන ගොස් උඩුබැලි අතට දමා හිසට යටින් කොට්ටයක්ද තබා ගොස් තිබුණු බව මොරගහහේන පොලිසිය සඳහන් කරයි. පොලිසිය සැක කරන්නේ ඝාතනය වෙනත් ස්ථානයකදී සිදුකර මළ සිරුර මෙම ස්ථානයට ගෙනදමා ඇති බවය.

වැඩිදුර විමර්ශනවලට අනුව ඝාතනය සිදුකළ බව කියන මැල්සිරිපුර පදිංචි පුද්ගලයා පොලිසිය විසින් අත්අඩංගුවට ගත් අතර ඔහු මීට මාස දෙකකට ඉහතදී ආබාධිතවීම නිසා සේවයෙන් ඉවත් වූ ගුවන් හමුද භටයෙකු බව පොලිසිය සඳහන් කරයි. එසේම සැකකරු සන්තකයේ තිබී ඝාතනයට යොදගත් උල් කිණිස්සද පොලිසිය භාරයට ගෙන ඇත.



පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කරමින්.....



සිද්ධිය සිදුවූ ස්ථානය

## ගෙලේ හා වැලමිටේ තුවාල කැළැල් දෙකක්

## මළසිරුරේ හිසට කොට්ටෙකුත් තියලා

මෙම වෙන්දේසි ඉඩමේ සේවය කරන තවත් පුද්ගලයින් හත් දෙනෙකුගෙන්ද ප්‍රකාශ සටහන් කරගත් පොලිසියට අනාවරණය

## සැකකරු නිවසු ගුවන් හමුදා සෙබළෙක්

වී ඇත්තේ මරණකරු සැකකරුගේ ගෙල මිරිකීම නිසා ඇති වූ බහින්බස් වීමක් නිසා මෙය ගැටුමක් දක්වා දුරදිග ගොස් ඇති බවය.

මළ සිරුරේ ගෙල ප්‍රදේශයේ හා වම් අතේ වැලමිට ප්‍රදේශයේ තුවාල කැලැල් දෙකක් දක්නට ලැබෙන බවද පොලිසිය සඳහන් කරයි . මළ සිරුරට කොට්ටය තැබූ පුද්ගලයා කවුදැයි මෙතෙක් අනාවරණය වී නැත.

මළ සිරුර තිබූ ස්ථානයට පැමිණි හොරණ අධිකරණයේ මහෙස්ත්‍රාත් චන්දන කලංසූරිය මළ සිරුර පරීක්ෂා කිරීමෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීම සඳහා සිරුර හොරණ මූලික රෝහලේ තැන්පත් කරන ලෙසත් අත්අඩංගුවට ගත් සැකකරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙසත් පොලිසියට නියෝග කළේය

පානදුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමන්ත වෙදගේ, සහකාර පොලිස් අධිකාරි උදය කුමාර යන නිලධාරීන්ගේ මෙහෙයවීම මත මොරගහහෙන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තුසිත වික්‍රමරත්න, අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ඒ. අජිත් පොලිස් සැරයන් 13428 සම්පත් පොලිස් කොස්තාපල්වරුන් වන 102543 රුක්ෂාන් 93389 ජයවර්ධන ,100355 ආරියවංශ ,16963 රොෂාන් කොට්ඨාස බුද්ධි ඒකකයේ පොලිස් කොස්තාපල් 91214 වන්නිනායක පොලිස් විශේෂ කාර්යාංශය පොලිස් කොස්තාපල් 91410 ගජනායක යන නිලධාරීහු මේ පිළිබඳ පරීක්ෂණ සිදුකළහ.

■ එෆ්.අස්ලම්

■ බිමල් ජයසිංහ -බණ්ඩාරගම



කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# ත්‍රිරෝද රථ අලංකරණ කලාවට රජයෙන් දිරියක්!

ත්‍රිරෝද රථ අලංකරණය කිරීම සඳහා ත්‍රිරෝද රථ හිමියන් කළ ඉල්ලීමට රජයේ අනුමැතිය ලැබී තිබෙන බව දැනගන්නට තිබේ. ඒ අනුව යම් යම් කොන්දේසිවලට යටත්ව එම අනුමැතිය හිමිව ඇතැයි මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සඳහන් කරයි. මේ පිළිබඳව ගැසට් නිවේදනයක් නිකුත් කළේ ඉකුත් ආණ්ඩුව සමයේදීය. ඒ 2021 වසරේදීය. එවක ආණ්ඩුවේ අගමැතිවරයා සහ ප්‍රවාහන රාජ්‍ය ඇමැතිවරයා හමුවූ ත්‍රිරෝද රථ හාම්පුතුන්ගේ සහ රියැදුරන්ගේ සංගම් කළ ඉල්ලීම අනුව එකී ගැසට් නිවේදනය නිකුත් කර තිබිණි. ඔවුන් එවැනි ආකාරයේ ඉල්ලීමක් කිරීමට හේතු වූයේ විවිධ කැලි බැලි සවි කළ ත්‍රිරෝද රථ නිරන්තරයෙන් පොලිස් රථවාහන අංශයේ නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක්වූ හෙයිනි. කෙසේ වුවද අලුත් නෛතික ප්‍රතිපාදන අනුව ත්‍රිරෝද රථ රියැදුරන්ට තමන්ගේ තුන්රිය තොරණ සේ අලංකාරවත් කර මහ පාරේ ධාවනය කළ හැකිවනු ඇත. සමහර විට මේ ආකාරයේ නෛතික අවසරයක් ලබාදීමට ආණ්ඩුව යොමු වන්නට ඇත්තේ රටේ ත්‍රිරෝද රථ අලංකරණය කිරීමේ කලාවට දිරි දීමක් හැටියට විය හැකිය. රට වටේ එපමණ මෙපමණ කළ නොහැකි ප්‍රශ්න තිබුණද එවැනි කරුණක් නොපමාව ආණ්ඩුවේ අවධානයට ලක්වූයේ එනිසා නොවිය හැකි යැයිද යමෙකුට තර්ක කළ හැකිය. ඉදිරියේ පැවැත්විය හැකි ජනාධිපතිවරණය ආදී මැතිවරණ කෙරෙහි බලාපොරොත්තු තබාගෙන මෙවැනි තීරණයක් ගන්නට ඇතැයි විපක්ෂයේ කෙනකුට කල්පනා කළ හැකිය. එකී කල්පනාව පදනම් රහිත නොවන්නේ දීපව්‍යාප්ත සුවිසල් ත්‍රිරෝද රථ ප්‍රජාව දෙස බලන විටය.

මෙරට ආර්ථිකය විවෘත කර වසරක් යාමට මත්තෙන් එනම් 1978 වර්ෂයේ මෙහි වෙළෙඳ පොළට ත්‍රිරෝද රථ හඳුන්වා දෙනු ලැබීය. සාමාන්‍ය ජනතාවගේ ප්‍රවාහන පහසුව සැලසීම, රටේ තිබුණු රැකියා ව්‍යුක්තිය ආදී කරුණු පදනම් කරගෙන මෙම තුන්රිය දෙරියන් අටරියන්ලා අතර බෙහෙවින් ජනප්‍රිය වන්නට විය. සංඛ්‍යාලේඛන අනුව දීපව්‍යාප්ත ත්‍රිරෝද රථ ප්‍රමාණය එකොළොස් ලක්ෂ පනස්දහස ඉක්මවයි. ඉන් රථ ලක්ෂ අටකට වැඩි ප්‍රමාණයක් ප්‍රවාහන කටයුතු සඳහා යොදවයි. එසේම කුලී රථ සේවාවේ යෙදෙන්නෝද නොයෙක් ස්වයං රැකියාවල නිරත වන්නෝද මෙසේ ත්‍රිරෝද රථය පාවිච්චි කරති. ගම්වල යම් මට්ටමකින් ආර්ථිකය ගොඩනගා ගත් බොහෝ පවුල්වල ත්‍රිරෝද රථයක් දැකිය හැකිය. එක්තරා ආකාරයකින් බලන කල ඉන්දියාව ආරම්භ කළ ත්‍රිරෝද විප්ලවය ලංකාවම ඩැහැගෙන තිබේ. එය විප්ලවයක්ද, කුමන්ත්‍රණයක්ද යන ගැටලුව ඇතිවූයේ රටේ සංවර්ධනයට යොදගත හැකි අගනා තරුණ ශ්‍රමය ත්‍රිරෝද රථ අතරේ දියවී යන හෙයිනි. මෙම කරුණ නිසා වයස තිස්පහට අඩු පුද්ගලයන්ට ත්‍රිරෝද රථ බලපත් නිකුත් නොකිරීමටද සාකච්ඡවක් පහුගිය කාලයේ පැවැතිණි. මේ එක් පැත්තකි. 2018 දී කළ ගණනයන් අනුව ත්‍රිරෝද රථ වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ බස්නාහිර පළාතේය. මෙම ත්‍රිරෝද රථ සේවාව ප්‍රමාණාත්මකව හා සංඛ්‍යාත්මකව වර්ධනය වී තිබුණද එය තවම ගුණාත්මක සේවාවක් බවට පත්කර ගැනීමට අපට හැකිවී නොමැත. සමස්තයක් වශයෙන් අනෙක් ක්ෂේත්‍ර සේම ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයද අර්බුදයකි. පිස්සාගේ පලා මල්ල වැනි ක්ෂේත්‍රයකි. ත්‍රිරෝද රථ ලංකාවට හඳුන්වා දී දශක හතරකට වැඩි වුවද තවම එය ගුණාත්මක සේවාවක් බවට පත්කර ගැනීමට නොහැකි වී තිබෙන්නේ මහජනතාව ගැන සිතා ඒ ඒ ආණ්ඩුවලට තීන්දු තීරණ ගත නොහැකි වූ හෙයිනි. බොහෝ දුරට ඒ ඒ කාලවල පැවැති ආණ්ඩු කල්පනා කළේ ත්‍රිරෝද රථ මත කේන්ද්‍රගතවී තිබෙන ඡන්ද ප්‍රමාණය කෙරෙහිය. සමහර දේශපාලනඥයෝ, ත්‍රිරෝද රථ රියැදුරන් සහ හිමිකරුවන් තමන්ගේ ප්‍රධාන සාධකයක් බවට පත්කර ගත්තෝය. එවැනි ත්‍රිරෝද රථ දේශපාලනඥයෝද මෙරට සිටිති. දැනුදු එහි වෙනසක් නොමැති බව පෙනෙන්නේ ත්‍රිරෝද රථ සේවාව ගුණාත්මක සේවාවක් බවට පත්කිරීම සඳහා ගත හැකි නෛතික පියවර ගන්නවා වෙනුවට ඒවා තොරණ සේ සැරසීමට නම් නොපමාව පියවර ගන්නා හෙයිනි.

අපට දැනගැනීමට තිබෙන කරුණු අනුව ආණ්ඩුව ත්‍රිරෝද රථවල සවිකරන කැලි බැලිවලින්ද මුදලක් අයකිරීමට සැරසේ. ප්‍රවාහන ඇමැති ධුරය දරන ඇමැතිවරයා ආර්ථික විද්‍යාවද දන්නා හෙයින් ඔහුගේ මහෞෂධ මොළදණ්ඩට මෙවැන ආකාරයේ කල්පනාවක් පහළ වූවා විය හැකිය. සියලුම ත්‍රිරෝද රථවලට මීටර් සවිකිරීම, ත්‍රිරෝද රථවල ගමන් කරන මගීන්ට රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම, පරිසර හිතකාමී අයුරින් තාක්ෂණය සකස් කිරීම ආදී යෝජනා වරින් වර ඉදිරිපත් කළේ මෙකී සේවාව ගුණාත්මක කිරීමටය. ත්‍රිරෝද රථ සේවාව ගුණාත්මක නොකිරීම හේතුවෙන් දිනපතා සිදුවන මාරාන්තික අනතුරු ප්‍රමාණය ඉහළ යමින් තිබේ. එහෙත් මේ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් නොමැති බව සඳහන් කළ යුතුය. ත්‍රිරෝද රථවල පැටවිය හැකි බර ප්‍රමාණයද ඉතාම සීමාසහිතය. සීමාව ඉක්මවා පුද්ගලයන් රැගෙන ගිය බොහෝ ත්‍රිරෝද රථ අනතුරට ලක්වූ වාර කෙළවරක් නොමැත. එසේ තිබියදී ත්‍රිරෝද රථවල විවිධාකාර කැලි බැලි සවි කිරීමට ඉඩ දීම මෙකී අනතුරු වැඩිවීමට හේතුවනවාට සැකයක් නොමැත. එසේම මෙසේ කැලි බැලි සවිකර ගත් ත්‍රිරෝද රථ රථවාහන බහුල මාර්ග හරහා ගමන් කිරීමේදීද අනතුරු වැඩිවනු ඇත. මෙකී කරුණු තේරුම් ගැනීමට නම් ප්‍රවාහන ඇමැතිවරයාට තොරණක් සේ සැකසූ ත්‍රිරෝද රථයක් දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුවට ධාවනය කරන්නැයි මහජනතාව ඉල්ලීමක් කළ යුතුය.

---

**පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අවුරුදු 80ක් පිරීම නිමිත්තෙන් පසුගිය 01 දා පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් විවෘත දිනයක් ප්‍රකාශයට පත් කරන ලදී. එදින විශාල ජනතාවක් විශ්වවිද්‍යාල භූමියට පැමිණීම නිසා එහි පරිසර පද්ධතියට හානිවූ බවට චෝදනා නැගිණි. එපමණක් එය මෙරට ජනසමාජයේ විනය පිළිබඳ පැතිකඩක් බවටද ඇතැම්හු පැවසූහ. අප මේ පිළිබඳව විමසුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති, මහාචාර්ය එම්.ඩී. ළමාවංශ ගෙන්ය.**



## පාසල් ළමයින් අපේ විශ්වවිද්‍යාල නැරැඹීමෙන්

# පිටරට විශ්වවිද්‍යාලවලට යෑමේ ප්‍රවණතාව අඩුවේවි

**පසුගියදා පේරාදෙණිය විශ්වවිද්‍යාලය විවෘත දිනයක් ප්‍රකාශයට පත් කළා. එවැනි සුවිශේෂී තීන්දුවක් ගැනීමට විශ්වවිද්‍යාලය තීරණය කළේ ඇයි?**

ඒ සඳහා කරුණු කිහිපයක් හේතු වුණා. විශ්වවිද්‍යාලයක් යැපෙන්නෙ මහජන මුදල්වලින්. එම නිසා මහජනතාවට විශ්වවිද්‍යාලයක් නැරඹීමේ අවස්ථාව තිබෙනවා. ඒ වගේම පාසල් ශිෂ්‍යයන්ට ඉගෙනීමට බොහෝ දේවල් විශ්වවිද්‍යාලයේ තිබෙනවා. අනෙක් කාරණය වන්නේ, මහජනතාව සහ විශ්වවිද්‍යාල අතර සමීප සබැඳියාවක් තිබිය යුතුයි. මේ හේතු සාධක පාදක කරගෙන විශ්වවිද්‍යාලය විවෘත කිරීමට තීරණය කළා. ඒ වගේම තවත් සුවිශේෂී කරුණක් සඳහන් කළ යුතුයි. අපි විවෘත දිනය පැවැත්වූයේ නොමිලේ. ප්‍රවේශ පත්‍රයකට හෝ මහජනතාවගෙන් කිසිදු මුදල් අය කිරීමක් සිදු කළේ නැහැ. විශාල ජනගහණයක් පැමිණීම අපේක්ෂා කළ නිසා හදිසි රෝගී තත්ත්වයන්ට මුහුණ දීමට ගිලන් රථ තුනක්ද සූදනම් කර තිබුණා. ඒ සඳහා අපට පූර්ව සූදනමක් තිබුණා. ඒ වගේම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව දැඩි කැපවීමකින් මේ අවස්ථාව සාර්ථක කරගැනීමට දයකත්වය ලබා දුන්නා.

**ලක්ෂ දෙකකට වැඩි පිරිසක් විවෘත දිනයේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලය නරඹන්නට පැමිණ තිබෙනවා. විශ්වවිද්‍යාලයකට එතරම් ආකර්ෂණයක් ලැබීමට හේතුව කුමක් ද?**

අපේ රටේ ජනතාව විශ්වවිද්‍යාලවලට විශාල වශයෙන් ගරු කරනවා. ඒකට හේතුව, අධ්‍යාපනය නමැති සංකල්පයට පවතින ගරුත්වයයි. ඒ වගේම පේරාදෙණිය සරසවියේ සුන්දරත්වය විඳීමටත්, එහි පවතින මහා දැනුම් සම්භාරය පිළිබඳ කරුණු දැනගැනීමටත් මහජනතාව විශාල කැමැත්තක් දක්වනවා. තමන්ගෙ දරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට දෙමවුපියන් විශාල කැමැත්තකින් පසුවෙනවා. මේ නිසා සමාජය තුළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට විශාල ආකර්ෂණයක් පවතිනවා.

**විශ්වවිද්‍යාලය විවෘත කිරීමට ගත් තීරණය ඇතැමෙක් විවේචනය කළා. ඉන් විශ්වවිද්‍යාල පරිසරයට හානි සිදුවූ බවටත් ඇතැම් පිරිස් චෝදනා කළා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ පැහැදිලි කිරීම කොහොමද?**

අපි සියලුම තරාතිරම්වල පිරිස්වලට විශ්වවිද්‍යාලය නරඹන්නට ආරාධනා කළා. ලක්ෂයක පමණ පිරිසක් පැමිණෙනු ඇතැයි අපි බලාපොරොත්තු වුණා. නමුත් ලක්ෂ දෙකක ජනගහණයක් එදින විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණියා. විශාල පිරිසක් පැමිණීම නිසා විශ්වවිද්‍යාලයේ තණකොළ සහ මල් පැළවලට හානි සිදුවූ බවට ඇතැමුන් සඳහන් කළා. එය අතිශයෝක්තියක් සහ දූර්මත පැතිරවීමක්. තණකොළවලට හෝ මල්පැළවලට හානි කිරීමට අපිටද අවශ්‍යතාවක් නැහැ. අපිත් ඒ සුන්දරත්වය පවත්වාගෙන යෑමට කැමතියි. කෙසේ නමුත් මේ විවේචන එක්ක විශ්වවිද්‍යාලය තවදුරටත් ජනතාව අතරට ගියා. විශ්වවිද්‍යාලයට තවදුරටත් හොඳ ප්‍රචාරණයක් ලැබුණා. අනෙක් කාරණය තමයි විවෘත දිනය නැරඹීමට දිවයිනේ සතර කොනින්ම පැමිණි ජනතාව තමාට ලැබුණු අවස්ථාව පිළිබඳ සතුටින් සිහිපත් කරමින් මෙම කාර්ය අගය කළා. එම නිසා දූර්මත පැතිරවීම විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණි ජනතාවට සිදු කරන අගෞරවයක්.

**විවෘත දිනයේදී එක් එක් පීඨවලට ස්වකීය අධ්‍යාපන, පර්යේෂණ ප්‍රතිඵල සමාජගත කරන්නට අවස්ථාව ලැබුණා. එය ජාතික අධ්‍යාපන පද්ධතියට යම් බලපෑමක් කිරීමට සමත්වූවා යැයි ඔබ විශ්වාස කරනවද?**

ඔව්, මේ වගේ අවස්ථාවක පාසල් ශිෂ්‍යන්ට විශ්වවිද්‍යාලයේ පවතින උපාධි පාඨමාලා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙනවා. උසස් පෙළ විභාගය සමත් වී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට සිටින ශිෂ්‍යන්ට තම උපාධි පාඨමාලාව තෝරා ගැනීමට මේ අවස්ථාවෙන් යම්කිසි රුකුලක් ලැබෙනවා. මීට පෙර ද පීඨ මට්ටමෙන් විවෘත දින සංවිධානය කරල තිබෙනවා. එහි අරමුණ වූයේද අපේ රටේ ශිෂ්‍ය ප්‍රජාවට තමාගේ උසස් අධ්‍යාපනය පිළිබඳ දැක්මක් ඇති කර ගැනීමට සහයෝගය ලබා දීමයි. එය ජාතික අධ්‍යාපන පද්ධතියට විශාල දයකත්වයක් සපයනවා. පීඨ වශයෙන් ගත් විට නිදසුන් කිහිපයක් ඇසුරින් මේ කරුණ පැහැදිලි කරන්න පුළුවන්. වෛද්‍ය පීඨය පුද්ගලයන්ට වැළඳෙන රෝග පිළිබඳ දැනුම්වත් කිරීම සිදු කළා. ඒ වගේම අධිකරණ වෛද්‍ය විද්‍යාව, ශෛල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සිදු කළා. වීඩියෝ දර්ශන යොදු ගනිමින් මේ තොරතුරු ජනතාවට ලබා දුන්නා. ශාස්ත්‍ර පීඨයේ ද වටිනා ප්‍රදර්ශන කුටි කිහිපයක් තිබුණා. ඉපැරණි සුසාන ක්‍රම පිළිබඳ ආකෘති සහිතව දැනුම්වත්කිරීම් සිදු කළා. ඒ වගේම පුස්කොළපොත් සැකසීම පිළිබඳ අවබෝධය ලබා දුන්නා. ඒ වගේම ප්‍රධාන පුස්තකාලයේ පැරණි පුස්කොළපොත් ඇතුළු වටිනා ග්‍රන්ථ එකතුව නැරඹීමට ද අවස්ථාව ලැබුණා. මේ ආකාරයට පීඨ වශයෙන් ඔවුන් සතු දැනුම සමාජයට ලබා දුන්නා. ඒ වගේම විශ්වවිද්‍යාලය නැරඹීමෙන් පාසල් ශිෂ්‍යන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්නට, පර්යේෂණ කරන්නට අභිප්‍රේරණයක් ඇති වෙනවා. එය ජාතික අධ්‍යාපන පද්ධතියේ දියුණුවට හේතු වෙනවා. එපමණක් නොව පාසල් ශිෂ්‍යන්ට දේශීය විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳ සුබවාදී ආකල්පයක් ඇති කිරීමට ද මෙය හොඳ අවස්ථාවක්. මන්ද විශ්වවිද්‍යාලය බැලීමට පැමිණි පාසල් ශිෂ්‍යන්ගේ අදහස වුණේ කෙසේ හෝ මෙම විශ්වවිද්‍යාලයට පැමිණිය යුතු බවයි. එබැවින් ඔවුන් විදේශීය විශ්වවිද්‍යාල වෙත ඇදී යාමේ ප්‍රවණතාව වෙනුවට දේශීය විශ්වවිද්‍යාල පද්ධතිය තෝරා ගැනීමට හිතකර බලපෑමක් මේ ඔස්සේ ඇති වෙනවා.

**පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භ කළ දිනයේ සිට සියලුම අංශවලින් ශ්‍රී ලාංකේය සමාජයට සාධනීය බලපෑමක් සිදු කළ විශ්වවිද්‍යාලයක්. වර්තමානය වෙද්දි ඒ බලපෑම ඒ විදිහට වෙන බව ඔබ විශ්වාස කරනවද?**

ඔව්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සෑම අවස්ථාවකම සමාජයේ සෑම අංශයකටම නායකත්වය ලබා දීල තිබෙනවා. මේ වන විට විශ්වවිද්‍යාලයෙන් 120 000ක් පමණ උපාධිධාරීන් ජාතියට බිහි කරලා තිබෙනවා. ඔවුන් ලෝකය පුරා සේවය කරනවා. ජාතික ජාත්‍යන්තර වශයෙන් ආයතන, කමිටුවල කටයුතු කරමින් අපේ වර්තමාන සහ ආදි විද්‍යාර්ථීන් සමාජයට මාර්ගෝපදේශකත්වය සහ නායකත්වය ලබා දෙනවා. ඒ වගේම විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ මගීන් සමාජයට මාර්ගෝපදේශකත්වය ලබා දෙනවා. නිදසුනක් ලෙස වෛද්‍ය පීඨය මගින් සිදු කරන කුඩා දරුවන්ගේ වකුගඩු සහ අක්මා බද්ධ කිරීමේ ව්‍යාපෘති සඳහන් කරන්න පුළුවන්. ඇත්තටම ලංකාවෙ කුඩා දරුවන්ට වකුගඩු බද්ධ කිරීමට ක්‍රමවේදයක් තිබුණෙ නැහැ. අපිට අවස්ථාව ලැබුණා පේරාදෙණිය රෝහල කේන්ද්‍ර කර ගෙන මෙම වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම සිදු කරන්න. දැනට කුඩා දරුවන්ගේ වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම 142ක් සිදු කර තිබෙනවා. ඊට අමතරව අවුරුදු තුන හමාරක විතර දැඩි කැපවීමක ප්‍රතිඵලයක් වශයෙන් කුඩා දරුවන්ට අක්මා බද්ධ කිරීමේ ශල්‍යකර්ම සිදු කිරීමට අපට අවස්ථාව ලැබුණා. ඒ විදිහට මිනිස්සුන්ට ශක්තියක් වෙන විදිහට විශ්වවිද්‍යාලය මාර්ගෝපදේශකත්වය සහ නායකත්වය ලබා දීලා තිබෙනවා.

**හැබැයි අද වෙද්දි සමාජයෙන් ඇහෙන කතාවක් තමයි එදා තිබුණු පේරාදෙණිය සරසවිය අද නෑ කියන එක. පේරාදෙණිය විතරක් නෙමෙයි සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියෙන් නව දැනුම් පද්ධති සමාජයට දායාද වෙන්නෙ නෑ කියන චෝදනා තියෙනව. මේ රටේ ප්‍රධාන විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයෙක් විදිහට ඔබට ඒකට පිළිතුරක් ඇති....**

කාලයත් සමග බොහෝ දේවල් වෙනස් වෙනවා. එය ස්වාභාවික දෙයක්. පේරාදෙණිය විශ්විද්‍යාලයත් කාලයත් සමග වෙනස්වීම්වලට ලක්වෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අතීත ප්‍රෞඪත්වයක් තිබුණා, එය වර්තමානයේ අඩු වී ඇති බව සමහර පිරිස් සඳහන් කරනවා. නමුත් විශ්වවිද්‍යාලය කාලයත් සමඟ ලබා තිබෙන විශාල දියුණුව ඒ පිරිස්වලට පෙනෙන්නෙ නැහැ. ලෝක ශ්‍රේණිගත කිරීම්ලට අනුව විශ්වවිද්‍යාලය අඛණ්ඩව ලෝකයේ මුල් 5% රැඳී සිටිනවා. අනාගතයේදී එය තවදුරටත් අභිවර්ධනය වෙනවා. ඒ වගේ අඛණ්ඩ දියුණුවක් පෙන්වන ආයතන ලංකාවේ තිබෙනවාද? පේරාදෙණිය විශ්වවිද්‍යාලය තව අවුරුදු විස්සකින් පමණ සියවන සංවත්සරය සමරනවා. ඒ අවස්ථාව වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජයග්‍රහණය කළ යුතු ඉලක්කයන් පිළිබඳ අපිට අඛණ්ඩ සංවාදයක් තිබෙනවා. ලෝකයේ සිදු වන වෙනස්වීම්වලට අනුගත වෙමින්, නව තාක්ෂණය සමග එම ඉලක්කවලට යා යුතුයි. ඒවගේම පරිසරය ආරක්ෂා කරමින්, සමාජ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙමින්, පශ්චාත් උපාධි අවස්ථා පුළුල් කරමින් එම ඉලක්ක සපුරා ගැනීම වැදගත් වෙනවා.

■ සංවාදය - ධනුෂ්ක පුෂ්ප කුමාර



## ගපිරීගේ කවිය

### අපි කම්මැලිම මිනිස්සුලු

"ලෝකයෙ කම්මැලි ම මිනිසුන් ඉන්න රටේ
ඉඳලා වැඩක් නෑ යා යුතු ලෝකෙ වටේ"
ක්‍රීඩා ඇමති පවසයි අමතමින් වටේ
මල පනිනව මේව ඇහුව ම හැටට හැටේ

කම්මැලි නොමැති ඇමතිල ඉන්නා රටක
කන්නට අඳින්නට වැසියට බැරි විටෙක
පම්පෝරියෙන් රට ගොඩගන්නට නොහැක
කවුරු ද වැරදි සැකයක් මතුවෙයි තැනක

# 12 හැවිරිදි සිසුවිය සමග පැනගිය 19 වියැති පෙම්වතාට ඇප

ඉෂාර රත්නකාර

කොළඹ ප්‍රසිද්ධ විදුහලක ඉගෙනුම ලබන 12 හැවිරිදි දැරියක සමග පැනගිය 19 හැවිරිදි පෙම්වතා ඇප මත මුදා හරින ලෙස අධිකරණය ඊයේ (13 වැනිදා) නියෝග කළේය.

අදාළ සැකකරු රුපියල් ලක්ෂය බැගින් වූ ශරීර ඇප 02ක් මත මුදා හරින ලෙස නියම කළ කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය 12 හැවිරිදි දැරිය මව භාරයට පත් කළේය. ඇයගේ මව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක බවද පැවසේ.

සැකකරු නිවස අසල ඇති රාත්‍රී අවන්හලක මුදල් අයකැමි වශයෙන් කටයුතු කරමින් සිටි අතරතුරදී අදාළ සිසුවිය සමග ප්‍රේම සබඳතාවයක් පවත්වා ඇතැයි මුල්ලේරියාව පොලිසිය දන්වා සිටියේය.

සිසුවිය සිය පෙම්වතා සමග පැනගොස් ඇති අතර ඒ පිළිබඳව සිසුවියගේ දෙමාපියන් කළ පැමිණිල්ලකට අදාළව වැලිවිට ප්‍රදේශයේ දී සැකකරු හා සිසුවිය අත්අඩංගුවට ගත් බවද පොලිසිය දන්වා සිටියේය.

සිසුවිය අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා හමුවට ඉදිරිපත් කර තිබෙන අතර එහිදී දැරිය අතවරයකට ලක්ව නොමැති බව අනාවරණය වූ බවද පොලිසිය දන්වා සිටියේය.

# පොලිසිය දැක ලංගම රියැදුරු බසය දමා පැන දුවයි

සමන් විජය බණ්ඩාර - මාවනැල්ල

ලංගම බසයක් නතර කරන්නැයි පොලිස් නිලධාරින් සංඥා කරද්දී, එහි රියැදුරු නොනවත්වා රිය ධාවනය කර බසය මහ මග දමා පැන ගොස් ඇතැයි හෙම්මාතගම පොලිසිය පැවසීය.

මාවනැල්ල නගරයේ සිට මගීන් රැගෙන හෙම්මාතගම දක්වා ධාවනය වූ එම ලංගම බසයේ රියදුරු බීමතින් රිය පදවන බවට ලද තොරතුරකට අදාළව පෙරේදා (12 වැනිදා) පස්වරුවේ පොලිස් නිලධාරින් විසින් රථය නතර කිරීමට සංඥා කර තිබේ.

මාවනැල්ල නගරයෙන් පස්වරු 06.20ට හෙම්මාතගම දක්වා ධාවනය වන මෙම බසය හෙම්මාතගම සිට මහනුවර දක්වා ඇතැම් අවස්ථාවල ධාවනය කෙරෙන අතර, දවසේ වැඩි කාලයක් මාවනැල්ල සිට හෙම්මාතගම අතර මගීන් ප්‍රවාහනය සිදු කරයි.

සුපුරුදු පරිදි 12 වැනිදා පස්වරුවේ මගීන් විශාල ප්‍රමාණයක් රැගෙන මෙම බසය හෙම්මාතගම දක්වා ධාවනය වන අතරතුරදී ගෝනාවල ප්‍රදේශයේදී හෙම්මාතගම පොලිස් ස්ථානයේ රථවාහන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක වයි. වික්ටර් සහ පොලිස් කොස්තාපල් උදය කුමාර විසින් බසය නැවත්වීමට සංඥා කර තිබේ. ඉන්පසු රියැදුරු බසය නොනවත්වා ධාවනය කර ඇත්තේ අතරමගදී මගීන් ද බැස්සවීමකින් තොරවය. පොලිස් නිලධාරින් යතුරුපැදියකින් බසය ලුහු බැඳ ඇති අතර, කිලෝමීටරයක පමණ දුරක් වේගයෙන් ධාවනය කිරීමෙන් අනතුරුව බසය මාර්ගය අයිනේ නවත්වා රියදුරු බසයෙන් පැන දිව ගොස් තිබේ.

මේ අතර, මගීන් රස්තියාදු නොකර හෙම්මාතගම නගරයට බසය ගෙනවිත් ඇත්තේ පොලිසියේ රථ වාහන අංශයේ නිලධාරියකු විසිනි.

එම බසය පොලිසිය වෙත රැගෙන ගොස් එහි කොන්දොස්තරවරයාගෙන් කට උත්තර ලබා ගෙන ඊයේ (13 වැනිදා) රථය නිදහස් කළ බව පොලිසිය පැවසීය.

ඒ වන විට කාර්යාල සේවකයන්, දරුවන් ඇතුළු විශාල මගීන් පිරිසක් එහි සිට ඇත. එම මගීන් පවසන්නේ රියදුරා බීමතින් සිටි නිසා පැන දුවන්නට ඇති බවයි.

අණ නොතකා ධාවනය කිරීම සහ අපරීක්ෂාකාරී රිය පැදවීම ඇතුළු කරුණු කිහිපයකට අදාළව රියැදුරුට එරෙහිව නඩු පැවරූ බව පොලිසිය සඳහන් කළේය.

හෙම්මාතගම පොලිසියේ මෑතකදී වැඩ භාර ගත් රථ වාහන අංශයේ ස්ථානාධිපති වයි. වික්ටර් විසින් නිරතුරුවම බීමත් රියැදුරන් සහ වැරැදි කරන වෙනත් රියදුරන් අත්අංඩගුවට ගන්නා බැවින් ප්‍රදේශවාසිහු ද ඔහුට ප්‍රශංසාව පුද කළහ.

# සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියට පවරාගත් කුඹුරු ඉඩම් නිදහස් නොකිරීම විශාල ප්‍රශ්නයක්

## - මධුර විතානගේ කියයි

සාලිය කුමාර ගුණසේකර

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සඳහා පවරාගත් කුඹුරු ඉඩම් නිදහස් නොකිරීම හේතුවෙන් අද වනවිට විශාල සමාජ ප්‍රශ්නයක් උද්ගතව ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ පැවසීය.

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පසුගියදා පැවැති කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඔහු මේ බව කීවේය. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියේ දුම්රිය ස්ථානය රාජගිරිය, වැලිකඩ ජ්ලාසා වෙළෙඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිරිපිට ඉදිකරන බවට දැනුම්දීමෙන් පසු ඒ ආසන්නයේ වූ බැංකු ඉවත් කිරීම නිසා විශාල ආදායමක් අහිමිවූ බවද මන්ත්‍රීවරයා සඳහන් කළේය. මෙම සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සිදු කරන්නේ දැයි මන්ත්‍රීවරයා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගෙන් විමසූ අතර, එහිදී එම නිලධාරීන් කියා සිටියේ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මීට පෙර භාරගෙන තිබුණේ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් බවයි.

# කඩින් කඩ වැස්ස හේතුවෙන් ඩෙංගු අනතුර පහවෙලා නැහැ

## - කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී

සාලිය කුමාර ගුණසේකර



කඩින් කඩ ඇඳහැලෙන වැසි තත්ත්වය හේතුවෙන් ඩෙංගු අනතුර පහව නැතැයි කොළඹ මහ නගර සභාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී රුවන් විජයමුණි පැවසීය.

සතියකට වාර්තා වන ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 139 සිට විසි ගණනක් දක්වා අඩුවී ඇතැයි ද ඔහු කීවේය. කොළඹ දිස්ත්‍රික්කයෙන් ඩෙංගු රෝගීන් 11,103 දෙනකු හඳුනාගෙන ඇති අතර, කොළඹ නගරයෙන් ඩෙංගු බවට සැකකරන රෝගීන් 2,260 දෙනකු හඳුනාගෙන ඇති බවද ප්‍රධාන වෛද්‍ය නිලධාරිවරයා පැවසීය. එම පිරිසෙන් 1,933 දෙනකු ඩෙංගු රෝගීන් බව වෛද්‍ය පරේයෂණාගාර වාර්තාවලින් අනාවරණය වී ඇතැයිද හෙතෙම කීවේය.

2017 වසරට පසුව වැඩිම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූයේ මේ වසරේදී බවද ප්‍රධාන වෛද්‍ය නිලධාරිවරයා සඳහන් කළේය.

කොළඹ නගරයේ මැද කොළඹ, බොරැල්ල හා කුරුඳුවත්ත ප්‍රදේශවලින් ඩෙංගු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන බවද ඔහු පැවසීය.

# ගෙවුණු මාස හයට ත්‍රිපෝෂ පැකට් ලක්ෂ 37ක් රට පුරා බෙදුවා

## - ත්‍රිපෝෂ සමාගමේ සභාපති

අශිකා ජයවීර



මෙම වසරේ ගෙවුණු මාස හයක කාලයේදී ත්‍රිපෝෂ පැකට් ලක්ෂ 37ක් රට පුරා බෙදා හැර ඇතැයි ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපති දීප්ති කුලරත්න පැවසීය.

මාසයකට ත්‍රිපෝෂ පැකට් ලක්ෂ 19ක් අවශ්‍ය නමුත්, දැනට නිෂ්පාදනය කෙරෙන්නේ පැකට් ලක්ෂ 13ක් පමණක් බව ඊයේ (13 වැනිදා) මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා කීවේය.

මාස 06 සිට අවුරුදු 03 දක්වා වයසැති දරුවන්ට ලබාදෙන ත්‍රිපෝෂවලට අදාළ නිර්ණායකයන්හි පවතින ගැටලුක් හේතුවෙන් එම වයස් කාණ්ඩයට අදාළව ත්‍රිපෝෂ නිෂ්පාදනය නොකිරීම ඊට හේතුව යැයි ද ඔහු පැවසුවේය.

එම නිර්ණායක සම්බන්ධ ගැටලුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිරාකරණය කරදී මෙන් පසුව අදාළ වයස්වල දරුවන් සඳහා ත්‍රිපෝෂ සැපයීමේ හැකියාව සිය සමාගමට තිබෙන බවත් මේ වන විට ත්‍රිපෝෂ සමාගමට තිබෙන විශාලතම ගැටලුව බඩ ඉරිඟු හිඟය බවත් සභාපතිවරයා සඳහන් කළේය.

එමෙන්ම මෙරට වෙළෙඳපොළ අවශ්‍යතාවට සරිලන පරිදි බඩ ඉරිඟු නිෂ්පාදනය කරගැනීමට තවමත් ශ්‍රී ලංකාවට හැකියාවක් නොමැති බවද මෙරටට අවශ්‍ය බඩඉරිඟු ප්‍රමාණය හරියටම ලැබුණහොත් අඛණ්ඩව දින 20කදී රටටම අවශ්‍ය ත්‍රිපෝෂ පැකට් ලක්ෂ 19 නිපදවන්නට හැකි බවද සභාපතිවරයා පෙන්වා දුන්නේය.

# විජේරාමේ අලෙවිසලකින් යතුරුපැදි අමතර කොටස් ඉස්සූ සැකකරුවන් දෙදෙනකු කොටු

බිමල් ජයසිංහ - බණ්ඩාරගම

මීට වසර දෙකකට පමණ ඉහතදී මහරගම, විජේරාම ප්‍රදේශයේ පිහිටි යතුරුපැදි අමතර කොටස් අලෙවිසලකින් රුපියල් ලක්ෂයකට අධික වටිනාකමකින් යුතු අමතර කොටස් සොරාගත් දෙදෙනකු බස්නාහිර පළාත් දකුණු දිසාව අපරාධ කොට්ඨාසය විසින් සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

ව්‍යාපාරික ස්ථානයේ හිමිකරු හඳුනන පුද්ගලයකු තවත් අයකු සමග ත්‍රිරෝද රථයකින් පැමිණ ව්‍යාපාරික ස්ථානයේ පිටුපස ප්‍රදේශයේ කතාබහ කරමින් සිටි අවස්ථා කිහිපයකදී යතුරුපැදි සහ යතුරුපැදි අමතර කොටස් සොරා ගෙන තිබූ බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී තිබිණි.

ඒ සම්බන්ධයෙන් මහරගම පොලිසියට ලද පැමිණිල්ලක් අනුව සිදුකළ විමර්ශනවලින් පසු සැකකරුවන් දෙදෙනා ගල්කිස්ස, බඩෝවිට සහ බොරලැස්ගමුව ප්‍රදේශවලදී අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන්ගෙන් සිදු කළ ප්‍රශ්න කිරීමෙන් පසු සොරාගත් දේපළ හෝමාගම, පංචිකාවත්ත ආදී ප්‍රදේශවලට විකුණා තිබියදී සොයාගත් බව පොලිසිය පැවසීය.

සැකකරුවන් දෙදෙනා නුගේගොඩ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

# මරණ දඬුවම නියම වූ අයෙක් රෝහලේදී මරුට

ඉෂාර රත්නකාර

දුම්බර බන්ධනාගාරයේ රඳවා සිටි මරණීය දණ්ඩනය නියම වූ විත්තිකරුවකු පෙරේදා (12 වැනිදා) හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් මහනුවර රෝහලට ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් තිබේ.

මෙලෙස මියගොස් ඇත්තේ කුලියාපිටිය මහාධිකරණය විසින් මරණ දඬුවම නියම කර තිබූ සූරියගොඩ, මුරුතලාව ලිපිනයේ පදිංචිකරුවකු වූ 74 හැවිරිදි ඩී. ප්‍රේමසිරි විලේගොඩ නමැත්තාය.

# බාල වයස්කාරිය දූෂණය කළ බව කියන පෙම්වතා හැංගිලා

## සැකකරු සොයා විමර්ශන

දීපා වසන්ති එදිරිසිංහ

දහතුන් වියැති බාල වයස්කාර පෙම්වතිය දූෂණය කළ බව කියන සැඟවී සිටින ෂෙහාන් මිහිරංග නමැති සැකකරුවකු සොයා හොරණ මූලස්ථාන පොලිසිය විමර්ෂණ අරඹා තිබේ.

ස්ථිර රැකියාවක් නොමැති එම පුද්ගලයා දහතුන් හැවිරිදි දැරිය සමග ප්‍රේම සබඳතාවක් ඇති කරගෙන තම මිතුරියකගේ නිවසට කැඳවාගෙන ගොස් පසුව දූෂණය කර ඇතැයි පැවසේ.

ඉකුත් 11 වැනිදා සිදු වූ එම සිදුවීම පිළිබඳව දැරිය ඥාතීන්ට දැන්වීමෙන් පසු පොලිසියට පැමිණිලි කර ඇත. අදාළ සැකකරු මේ වන විට ප්‍රදේශයෙන් පලාගොස් සිටින අතර ඔහු අත්අඩංගුවට ගැනීමට විමර්ෂණ අරඹා ඇතැයි හොරණ මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චින්තක පනාවල 'අරුණට' පැවසීය.

## ග්‍රහචාරය

2023 ජූනි මස 14 වැනි සිකුරාදා

රාහු කාලය

උදේ 10.42 - මධ්‍යහ්න 12.17

රාත්‍රී 10.50 - මැදියම 12.17

ශුභ දිශාව - දකුණ

මරු - ගිනිකොණ

### මේෂ

යහපත් අදහස්

පොදු කටයුතුවලදී කාර්යක්ෂම හා තරගකාරී බවක් පෙන්නුම් කළද හැකි විටක නිශ්ශබ්දවීමට උනන්දුවක් ඇති කෙරේ. අන්‍යයන් හා කතාබහ ඉතාම කුලුපග වීමට උත්සාහ කෙරේ. යහපත් අදහස් ඇතද ඊට බාධක අවස්ථාද එළඹේ.

### වෘෂභ

සුබපල

වඩාත් පහසු දිනයක් සේ දැනෙනු ඇත. කතා බහෙත් ලිහිල් බවක් ඇති කර ගන්න. නිවාස සම්බන්ධ කටයුතුවල පල මඳ විය හැක. සුබපල ගෙනදෙන දිනයකි.

### මිථුන

රෝගකාරී හැඟීම්

වැඩි බර කතාව පාලනය කර ගන්න. වචන අන්‍යයන් නොමග යවනසුලු විය හැකිය. ඇහුම්කන් දීම වඩාත් ගැළපේ. රෝගකාරී හැඟීම් වුව පාලනය කර ගන්න. පොදු එකඟතාවන් තරමක් දුෂ්කර විය හැකිය.

### කටක

රැකියාවේ වෙනසක්

ජල හෝ ද්‍රව සම්බන්ධ ක්ෂේත්‍රවල කටයුතු කරන අයට පහසුකම් හෝ ලාභ ප්‍රයෝජන අත්විඳීමට ඉඩ ලැබේ. වෙළෙඳ ක්ෂේත්‍රයේ අයටද සාමාන්‍ය වශයෙන් ශුභ වේ. රැකියාවේ කටයුතුවල වරින්වර වෙනස්කම්වලටද ඉඩ ඇත.

### සිංහ

යහපත් දිනයකි

බෙහෙවින්ම යහපත් දිනයකි. බුද්ධිමත්ව කටයුතු කිරීමට උත්සාහ ගනී. ආගමික කටයුතුවලට සම්බන්ධවීමටද ඉඩ ලැබෙනු ඇත. පාර්ශ්වීය කටයුතුවලදී යම් යම් අපහසුතාවලටද ඉඩ ඇතිවිය හැක.

### කන්‍යා

ආගමික සබඳතා

උත්සාහයෙන් වැඩ කිරීමට උනන්දුවේ. රාජ්‍ය සේවාවන් හා සම්බන්ධකම් විශේෂයි. කතාබහ විලාශයන් නිරායාසයෙන්ම පාලනය වනු ඇත. ආගමික සබඳතාවන්ට ද ඉඩ ඇති කෙරේ. වැටීම් තැළීම් ගැන කල්පනාකාරී වන්න.

### තුලා

වතුරෙන් පීඩා

බොහෝදුරට නිහඬවම කාලය ගත වීමකට ඉඩ ඇති කෙරේ. විනෝද හෝ ප්‍රාසාංගික කටයුතුවලින් සාමාන්‍ය ඵල ඇති කරනු ඇත. දුර බැහැර කටයුතුවලටද ඉඩ ඇති කෙරේ. ජලය සම්බන්ධ කටයුතු (පිහිණුම්) ගැන ප්‍රවේශම් වන්න.

### වෘශ්චික

යහපත් වටපිටාවක්

රැකියාවේ කටයුතු සම්බන්ධව ඉක්මන්වීමට ඉඩ පෙනේ. ගිනි, ආරක්ෂණ කටයුතුවල යෙදෙන අයට විශේෂයි. අන්‍යයන් හා සුහද ගුණය කැපී පෙනේ. පාර්ශ්වීය සබඳතාවන්ට යහපත් වටපිටාවක් ඇති වේ.

### ධනු

බාධක මතුවේ

ඔබගේ අනන්‍යතාවන් පවත්වා ගෙන යාමේදී බාධක තත්ත්වයන්හි තවත් අඩුවීමකට ඉඩ ඇත. දැනුම පිළිබඳ හැඟීම් ඉස්මතු වීමට පුළුවන. උසස් අය හා සම්බන්ධවීම ඇතිවේ. සබඳතා තහවුරු කිරීම මඳක් අපහසු වේ.

### මකර

උසස් හැඟීම්

කතා විලාශයන් තවදුරටත් පාලනය කර ගැනීම වඩාත් උචිත වේ. උසස් හැඟීම් හා දැනුම ප්‍රකාශනයන්ට අවස්ථාවෝචිතව ඉඩ ලැබෙනු ඇත. ශරීර උෂ්ණාධික ස්වභාවයන් ගැන සැලකිලිමත් වන්න.

### කුම්භ

සමබර දිනයක්

එදිනෙදා කටයුතු මෙහෙයවීමේදී වඩාත් සමබර වීමට උත්සාහ කරන්න. සිතුම් පැතුම් විලාශයන් නිරවුල් බැවින් එය පහසු වේ. පාර්ශ්වකරුවන් හා සබඳතා ඉක්මන් වුවද ඊට පැවැතිය හැකි බාධක ගැනද විමසිලිමත් වන්න.

### මීන

ස්නායු දුබලතා

බුද්ධිමත්ව වඩාත් ගැළපෙන පරිදි කතා කිරීමේ ඉඩ ප්‍රස්ථා උදාවේ. වත්කම් සම්බන්ධයෙන්ද යහපත් වේ. සහෝදර සබඳතා හෝ ප්‍රයෝජන ලැබීම් සතුටුදායක වේ. ස්නායු දුබලතාවන්ට ඇති ඉඩකඩ ගැන සැලකිලිමත් වන්න.


පුංචි දූලා පුතාලාට දැන් පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම හරිම පිළිවෙළට ඉගෙන ගන්න

මාසික අධ්‍යාපනික පුවත්පත් 6ක්

ලියාපදිංචි පෙරපාසල් සඳහා විශේෂ වට්ටම්




පාඩම් සඳහා මාර්ගෝපදේශ නිර්දේශිත පින්තූර පොත් දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි

දැන්වීම් සඳහා විමසන්න ශෙහාන් - 076 1393811

දිවයින පුරා පුවත්පත් නියෝජිතයන්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක

# පින්ටොගෙ නින්දිත වාර්තාවට නීතිඥ සංගමය විරුද්ධ නොවීම ගැටලුවක්



## මට එරෙහි චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරනවා

### - සරත් වීරසේකර කියයි

තමා අධිකරණයට තර්ජනය කළා යැයි ශ්‍රී ලංකා නීතිඥ සංගමය නගන චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරන බවත් පසුගිය 07 වැනිදා තමා පාර්ලිමේන්තුවේදී කළ කතාව හොඳින් ශ්‍රවණය කරන ලෙසත් පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකර එම සංගමයට ඇනුම් දෙයි.


පසුගිය 11 වැනිදා උතුරු පළාතේ නීතිඥවරුන් පිරිසක් තමාට එරෙහිව කළ උද්ඝෝෂණය, කිසිදු සෙවිල්ලක් නොමැතිව කරන ලද සහාය දීමක් බව ද මන්ත්‍රීවරයා සඳහන් කළේය.

නමුත්, "රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ඔරලෝසු බට්ටෙක් මෙන් දෙපැත්තට වැනෙන බවත්, ඔවුන්ට කියවා අවබෝධ කිරීමට තරම් මොළයක් නැත්නම් ඔවුන් වහාම ගෙදර යා යුතු" බවට මීට මාස කිහිපයකට පෙර දෙමළ සන්ධානයේ මන්ත්‍රී සුමන්තිරන් පාර්ලිමේන්තුවේදී සිදු කළ ප්‍රකාශයට විරෝධය පළ නොකළේ සුමන්තිරන්ට බය නිසාදැයි මන්ත්‍රීවරයා නීතිඥ සංගමයෙන් ප්‍රශ්න කළේය.

එමෙන්ම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ ප්‍රවෘත්ති කාරක 'මොනිකා පින්ටෝ' නමැත්තිය විසින් මෙරටේ අධිකරණය සම්බන්ධයෙන් ජිනීවා මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ වාර්තාව මගින් අභූත චෝදනා රැසක් එල්ල කර ඇති බවත් අධිකරණයේ ස්වාධීනත්වය සහ අභිමානය ගැන කතා කරන නීතිඥ සංගමය මොනිකා පින්ටෝ විසින් අධිකරණය පිළිබඳව ඉදිරිපත් කළ එම අතිශය නින්දිත වාර්තාව ගැන කිසිදු විරුද්ධත්වයක් නොදැක්වීම ගැටලු සහගත බවද හෙතෙම කීවේය.

# රට ගොඩනංවන්න පූර්ණ මූල්‍ය විනයක් අත්‍යවශ්‍යයි

## රජය වැය කරන සෑම රුපියලකටම උපරිම වටිනාකමක් ලැබිය යුතුයි



### - ජනාධිපති රනිල් වික්‍රමසිංහ

**රට ගොඩනැගීමට මුල්‍ය විනය අත්‍යවශ්‍ය බවත්, රාජ්‍ය වියදම් පාලනයට මෙන්ම රාජ්‍ය නව ආදායම් උත්පාදනයට විධිමත් ක්‍රමවේද කඩිනමින් හඳුන්වා දෙන බවත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ පැවසුවේය.**

රජය වැය කරන සෑම රුපියලකටම උපරිම වටිනාකමක් ලබාගත යුතු නමුත්, බොහෝ විට රාජ්‍ය වියදම් ක්‍රියාවලිය තුළ එය සිදු නොවන බවද, කිසිදු ප්‍රතිලාභයක් නොමැති කටයුතු සඳහා රාජ්‍ය මුදල් සීමාවකින් තොරව වැය කිරීම මෙරට ආර්ථික අර්බුදයට හේතු වූ බවද ජනාධිපතිවරයා කීවේය.

රාජ්‍ය නව ආදායම් මාර්ග උත්පාදනය සඳහා උපාය මාර්ග සෙවීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳ රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටියගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුවේ වාර්තාව පෙරේදා (12 වැනිදා) ජනාධිපතිවරයාට භාර දුන් අවස්ථාවේදී හෙතෙම මේ බව කීවේය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා විධිමත් පරිසරයක් නිර්මාණය කිරීම, රාජ්‍ය ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා නව ක්‍රමවේද හඳුන්වාදීම සහ ඒ සඳහා ඩිජිටල් ආර්ථික පසුබිමක් සකස් කිරීමට අදාළ යෝජනා මෙම වාර්තාවට ඇතුළත්ය.

මෙම යෝජනා තවදුරටත් සාකච්ඡාවට බඳුන්කර ක්‍රම සහ විධි පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ජනාධිපතිවරයා රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටියට උපදෙස් දුන්නේය.

එහිදී ජනාධිපතිවරයා මෙසේ ද පැවසීය.

"ආදායම් බදු ගෙවිය යුතු ඇතැම් පාර්ශ්ව ආදායම් බදු ගෙවන්නේ නැහැ. ඒ වගේම රේගුවේ සිදුවන ප්‍රමාදයන් නිසා සම්පූර්ණ බදු ආදායම රජයට නොලැබීම පිළිබඳ වාර්තා වී තිබෙනවා. ඒ වගේම සුරාබදු පිළිබඳවත් එම චෝදනාව තිබෙනවා. ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට අප උත්සාහ කරන මෙම අවස්ථාවේ රට තුළ පූර්ණ මූල්‍ය විනයක් ඇති කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම අප මෙම ආදායම් උත්පාදන ක්‍රමවේදය ලබාගත්තේ එක්සත් රාජධානියෙන්. අද එම ක්‍රමවේද බොහෝ දුරට දියුණු කර තිබෙනවා. ඒ නිසා අලුත්ම ක්‍රමවේදය දෙස බලා අපට අවශ්‍ය ක්‍රමවේදය සකස් කළ යුතුයි. විගණන පනත තුළත් ඒ සඳහා නව නීති සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

මේ පිළිබඳ කැමරන් අග්‍රාමාත්‍යවරයා යටතේ කටයුතු කළ අමාත්‍යවරයා තමයි ෆ්‍රැන්සිස් මෝඩ් මහතා. මෙම අංශයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ අදහස් ලබා ගැනීමට අපි එතුමාටත් ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කර තිබෙනවා."

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති පිළිබඳ රාජ්‍ය ඇමැති රංජිත් සියඹලාපිටිය ද මෙසේ අදහස් දැක්විය.

"නව බදු හඳුන්වාදීම්, බදු ප්‍රතිශත ඉහළ නැංවීම යන සීමාවන්වල අප උපරිමයට ළඟා වී තිබෙනවා. ඒ නිසා අපට දැන් අවධානය යොමු කිරීමට සිදුව තිබෙන්නේ බදු පදනම පුළුල් කර ගැනීම සහ බදු දැලේ තිබෙන සිදුරු අවම කිරීම යන කරුණු පිළිබඳවයි.

ඒ වගේම තරගකාරිත්වය සහ විනිවිදභාවයෙන් රජයේ ආදායම් ඉහළ නංවා ගැනීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා."

# සරසවි සිසුවකු දිවි නසා ගැනීමට තැත් කිරීමේ සිද්ධියට පාලන අධිකාරිය වගකිව යුතුයි

## - අන්තරෙන් පැමිණිල්ලක්

නිර්මාණී තිලකසිරි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨයේ ශිෂ්‍යයකු ජූනි 7 වැනිදා විශ්වවිද්‍යාල නේවාසිකාගාරයේදී සියදිවි හානිකර ගැනීමට උත්සහ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්ව වලට එරෙහිව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඊයේ (13 වැනිදා) පැමිණිලි කර තිබේ.

නවක වධ සිදුවීමක් සම්බන්ධයෙන් අදාළ සිසුවාට එරෙහිව විශ්වවිද්‍යාලයීය පාලනාධිකාරිය විසින් විමර්ශනයක් සිදුකර ඇති අතර, පසුව ඒ පිළිබඳ වැඩිදුර විමර්ශන සඳහා අපරාද පරීක්ෂණ දෙපාර්තමේනතුව වෙත භාරදී තිබේ. පැය පහකට ආසන්න කාලයක් සිදු කළ ප්‍රශ්න කිරීම්වලදී සිසුවාට කායික හා මානසික හිංසන සිදුකර ඇති බවට අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු මදූෂාන් චන්ද්‍රජිත් චෝදනා කළේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ එම ප්‍රශ්න කිරීම් වලදී සිසුවාගේ මුහුණ ආවරණය කර ඇති අතර, ඔහුගේ ශරීරය ද කාඩ්බෝඩ් වලින් ආවරණය කර පහරදී ඇතැයි ද හෙතෙම පැවසීය. තවද එම සිදුවීමෙන් පසු ඇතිවූ කනස්සල්ල හේතුවෙන් මෙම සිසුවා සියදිවි හානිකර ගැනීමට තැත්කර ඇති බැවින් අදාළ සිදුවීම සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පාලනාධිකාරිය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වගකිව යුතු බව ද ඔහු අවධාරණය කළේය.

# බදුල්ලේ හොර විදෙස් රැකියා ඒජන්සියක් වටලයි

නුවන් ආරියවංශ - ඇල්ල

බදුල්ල ධර්මදූත විද්‍යාලයට නුදුරින් පිහිටි අතුරු මාර්ගයක තට්ටු ගොඩනැගිල්ලක පළමු මහලේ කාමරයක පවත්වාගෙන ගිය නීති විරෝධි විදේශ රැකියා ආයතනයක් පෙරේදා (12 වැනිදා) වටලා එහි හිමිකරු විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විමර්ශන නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන ඇත.


58 හැවිරිදි එම සැකකරු මඩකලපුව, කල් අඩිහි පදිංචිකරුවකු බවත් බදුල්ල, කයිලගොඩහි තාවකාලිකව පදිංචිව ඔහු මෙම රැකියා ඒජන්සිය පවත්වාගෙන ගොස් ඇතැයි අනාවරණය වී ඇති බවත් විමර්ශන නිලධාරිහු පැවසූහ.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හාලිඇල කාර්යාලයට ලද පැමිණිල්ලකට අදාළව එම කාර්යාංශයේ ලියාපදිංචි නොවී පවත්වාගෙන ගිය බව කියන මෙම ඒජන්සිය වටලා තිබේ.

ඩුබායි, ජපානය, කටාර්, ප්‍රංශය සහ ඉතාලිය ඇතුළු රටවල් ගණනාවක විදේශ රැකියා ලබාදීමට පොරොන්දුවී පුද්ගලයන් 58 දෙනකුගෙන් ලබාගත් ලිපිලේඛනද සැකකරු සන්තකයේ තිබී සොයාගෙන ඇත.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඌව පළාත් ජ්‍යෙෂ්ඨ කළමණාකාර එස්. ගාල්ලගේ ගේ උපදෙස් පරිදි නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වසන්ත ඒකනායක, පරිපාලන නිලධාරි සම්පත් දුනුවිල, මාධවී බස්නායක, ආර්.එල්.එම්. ප්‍රදීප් යන නිලධාරිහු වැඩිදුර විමර්ශන සිදුකරති.

# සංචාරක ව්‍යාපාරය නංවන්න ජපන් සහායෙන් නව වැඩසටහනක්




ඒකාබද්ධ වැඩසටහනට එක්වූ USAID දූත මණ්ඩල ප්‍රධානීන් සහ සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරීන්

මෙරට සංචාරක ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඇමරිකා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ඉකුත් ද නව වැඩසටහනක් ආරම්භ කර තිබේ.

සංචාරක ආකර්ෂණය දිනා ගැනීම සඳහා සකස් කර තිබෙන මෙම වැඩසටහනට ත්‍රාසජනක මෙන්ම සංස්කෘතික අත්දැකීම්වල සිට සත්කාර සේවා ද අයත් වෙයි. මෙමගින් අපේක්ෂා කෙරෙන්නේ ලෝකය තුළ ශ්‍රී ලංකාව සිය සන්නාම අනන්‍යතාව තවතවත් තහවුරු කර ගැනීම සඳහා ඉඩකඩ විවර කර ගැනීම ය.

මෙම වසරේ සංචාරකයන් පැමිණීමේ කැපී පෙනෙන වර්ධනයක් පවතින බවත් එය කොවිඩ් වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් වසර කිහිපයක් පැවැති පසුබෑමෙන් අනතුරුව ශ්‍රී ලංකාව යළි සාමාන්‍ය තත්ත්වයට පත්වීමට සූදානම් බව පෙන්වන්නක් බවත් මෙම වැඩසටහනේ සමාරම්භක අවස්ථාවට එක්වූ ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ USAID දූත මණ්ඩල අධ්‍යක්ෂ ගේබ්‍රියල් ග්‍රාව් පැවසීය.

එම වැඩසටහනේ සමාරම්භයට එක් වූ USAID දූත මණ්ඩල අධ්‍යක්ෂ ගේබ්‍රියල් ග්‍රාව්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් සුරංගා විතානගේ , ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් උපාලි රත්නායක ඇතුළු පිරිස ඡායාරූපයේ වෙති.

# කොළඹ ආරක්ෂක සමුළුව නිමවෙයි



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා සමුළුව අමතමින්....

දකුණු ඉන්දීය සාගර කලාපයේ අන්තර් සම්බන්ධතාවය සහ ආරක්ෂක සහයෝගීතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් 7 වැනි කොළඹ ආරක්ෂක සමුළුව පෙරේදා (12 වැනිදා) පැවැත්විණි.

මෙවර සමුළුවේ සත්කාරකත්වය දරන මාලදිවයින වෙත සුබ පැතුම් එක් කරමින් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ආරම්භක දේශනය සිදු කළේය.

කලාපයේ සමුද්‍රීය ආරක්ෂාව සහතික කිරීමේ ක්‍රම පිළිබඳව සහ මේ සම්බන්ධයෙන් වන මෑතකාලීන වර්ධනයන් කෙරෙහි අවධානය යොමු කරමින් සාකච්ඡා කරන ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා සමුළුව අමතමින් සාමාජික රටවලට ආරාධනා කළේය.

මිනිස් ජාවාරම්, අන්තර්ජාතික අපරාධ, කලාපීය රටවල සාමයට අභියෝග කරන ත්‍රස්තවාදය, අන්තවාදය සහ රැඩිකල්කරණය සම්බන්ධ තර්ජන පිළිබඳ කරුණු ඔහුගේ දේශනයට ඇතුළත් විය.

තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමගම සයිබර් අපරාධ, දත්ත ඡේදන ක්‍රියාකාරකම් සහ සයිබර් ප්‍රහාර වැනි නව තර්ජන සඳහා කලාපීය රටවල් වඩාත් හොඳින් සූදනම් කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

# දේවගැති ජෙරොම්ගේ රිට් පෙත්සම ඉවත දමන්න



## නීතිපති අභියාචනාධිකරණයෙන් ඉල්ලයි

කේ.එස්. උදයකුමාර

බුද්ධාගම ඇතුළු අන්‍ය ආගම් වලට අපහාස කළ බව පවසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමා සැකකරුවකු ලෙස නම් කිරීම සහ අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා දේවගැති ජෙරොම් ප්‍රනාන්දු විසින් ඉදිරිපත් කළ දෙවැනි රිට් අයැදුම්පත විභාගයට නොගෙන නිෂ්ප්‍රභ කරන්නැයි නීතිපතිවරයා සහ අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු ඊයේ (13 වැනිදා) අභියාචනාධිකරණය හමුවේ ඉල්ලා සිටියහ.

මෙම පෙත්සම ඊයේ (13 වැනිදා) අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ඒ. මරික්කාර් යන මහත්වරුන්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ල ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ෂමින්ද වික්‍රම සහ ඇල්ලේ ගුණවංශ හිමියන් ඇතුළු පිරිසක් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මෙලෙස විරෝධය පළ කළහ. පෙත්සම් කැඳවනු ලැබූ අවස්ථාවේදී ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන අධිකරණය හමුවේ කරුණු දක්වමින් කියා සිටියේ තමන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පෙත්සම්කාර දේවගැතිවරයා අධිකරණය හමුවට පැමිණි තුන්වැනි අවස්ථාව මෙය බවයි.

ඔහු විසින් දැනටමත් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර ඇති අතර, එය ලබන 28 වැනිදා කැඳවීමට නියමිත බවද ජනාධිපති නීතිඥවරයා කීවේය.

තමන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමේ නියෝගයක් නිකුත් කරන මෙන් ඉල්ලා මෙම දේවගැතිවරයා මීට පෙර ද රිට් පෙත්සමක් ඉදිරිපත් කළ අතර, පසුව එය ඔහු විසින්ම කිසිදු හේතුවක් නොදක්වා ඉල්ලා අස් කරගත් බවද ජනාධිපති නීතිඥවරයා සිහිපත් කළේය.

එසේ තිබියදී පෙත්සම්කරු ලොව පුරා සංචාරය කරමින් ලන්ඩනයේ රැඳී සිට මෙරට අධිකරණය බලය අවභාවිතයට ලක් කරමින් මෙලෙස පෙත්සම් ඉදිරිපත් කොට විමර්ශන කටයුතුවලට බාධා සිදු කරමින් සිටින බවට චෝදනා කළ ජනාධිපති නීතිඥවරයා අදාළ පෙත්සම විභාගයට නොගෙන නිෂ්ප්‍රභ කරන ලෙස අධිකරණයෙන් අයැද සිටියේය.

නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ශමින්ද වික්‍රම ද කියා සිටියේ මෙම පෙත්සම නීතියට පටහැනි ලෙස ගොනුකර තිබෙන හෙයින් එය වහාම නිෂ්ප්‍රභ කළ යුතු බවයි.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුති පනත යටතේ තම සේවාදයකයා අත්අඩංගුවට ගැනීමට හෝ සැකකරුවකු ලෙස නම් කිරීමට නීතිමය හැකියාවක් නොමැති බවට තර්ක කළ පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක මෙම පෙත්සම සලකා බැලීම සඳහා කෙටි දිනයක් ලබා දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

කෙසේවෙතත් ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ අධිකරණය මෙම පෙත්සමට අදාළ විරෝධතා තිබේනම් ඒවා ජූලි 31 වැනිදට පෙර ගොනුකරන ලෙස වගඋත්තරකරුවන්ට නියෝග කළ අතර, පෙත්සම සලකා බැලීම සඳහා අගෝස්තු 31 වැනිද කැඳවන ලෙසද නියෝග කළේය.

# සනත් නිශාන්තට එරෙහි පෙත්සම් 3ක් යළි කැඳවයි

කේ.එස්. උදයකුමාර

රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත අධිකරණයට අපහාස කළ බව සඳහන් කරමින් ශ්‍රී ලංකා අධිකරණ නිලධාරීන්ගේ සංගමය සහ තවත් නීතිඥවරු දෙදෙනකු විසින් ගොනුකර ඇති පෙත්සම් 03ක් සැප්තැම්බර් 27 වැනිද යළි කැඳවන ලෙස අභියාචනාධිකරණය ඊයේ (13 වැනිද) නියෝග කළේය.

මෙම පෙත්සම් ඊයේ (13 වැනිද) අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න සහ ඒ. මරික්කාර් යන මහත්වරුන්ගෙන් සමන්විත විනිසුරු මඬුල්ල ඉදිරියේ කැඳවනු ලැබූ අවස්ථාවේදී වගඋත්තරකාර සනත් නිශාන්ත රාජ්‍ය අමාත්‍යවරයා අධිකරණය හමුවේ පෙනී සිටියේය.

එහිදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්වරිය අධිකරණයට දන්වා සිටියේ මෙම පැමිණිල්ලට අදාළව කටහඬ පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය බැවින් එය රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉදිරිපිට කිරීමට අවශ්‍ය බවයි.

එක් පෙත්සමක් ඉදිරිපත් කර තිබූ ශ්‍රී ලංකා අධිකරණ නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා කරුණු දක්වමින් එවැනි පරීක්ෂණයකින් තොරව මෙම පෙත්සම පවත්වාගෙන යාමට තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බව දන්වා සිටියේය.

ඒ අනුව පෙත්සම සැප්තැම්බර් 27 යළි කැඳවන ලෙස නියෝග කෙරුණි.

ශ්‍රී ලංකා අධිකරණ නිලධාරීන්ගේ සංගමය, ප්‍රියලාල් සිරිසේන සහ විජිත කුමාර යන නීතිඥවරුන් දෙදෙනා විසින් මෙම පෙත්සම් ඉදිරිපත් කර තිබිණි.

පෙත්සම්කරුවන් කියා සිටින්නේ ඉකුත් වසරේ අගෝස්තු 23 වැනිද හෝ ඊට ආසන්න දිනයක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවකදී අදහස් දැක්වූ සනත් නිශාන්ත මහතා



අරගලකරුවන්ට ඇප ලබා දීමේදී මහෙස්ත්‍රාත්වරු කටයුතු කළ ආකාරය විවේචනය කොට තිබූ බවයි.

එමගින් ඔහු අධිකරණයට අපහාසයක් සිදු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ඉල්ලමින් මෙම පෙත්සම් අභියාචනාධිකරණය හමුවේ ගොනු කර තිබේ.



අත්අඩංගුවට ගත් රත්‍රං

# ඩිංගි බෝට්ටුවකින් ඉන්දියාවට පන්නන්න හැදූ රන් කිලෝ අටක් අල්ලයි



අත්අඩංගුවට ගත් බෝට්ටුව

■ ජුඩ් සමන්ත-පුත්තලම

ඩිංගි බෝට්ටුකින් ඉන්දියාවට රැගෙන යමින් තිබූ රත්‍රං කිලෝ ග්‍රෑම් 08 යි ග්‍රෑම් 450 ක් තම බාරයට ගෙන ඇති නාවික හමුද නිලධාරීන් එම රත්‍රං තොගය රැගෙන යමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකුද අත්අඩංගුවට ගෙන ඇත.

12 වෙනිද කල්පිටිය - වන්නි මුන්දලම කලපුවේදී මෙම වැටලීම සිදු කර ඇත.

කල්පිටිය කලපුවේ සැක කටයුතු ලෙස යාත්‍රා කරමින් තිබූ ඩිංගි බෝට්ටුවක් මුර සංචාරක කටයුතු වල නිරත වෙමින් සිටි නාවික හමුද නිලධාරීන් දැක ඇති අතර නිලධාරීන් එම යාත්‍රව පරීක්ෂා කර තිබේ.

එම පරීක්ෂාවේදී බෝට්ටුව තුළ සඟවා තිබූ පර්සල් දෙකක් සොයා ගැනීමට නාවික හමුද නිලධාරීන්ට හැකි වී ඇත.රත්‍රං තොගය සමග යාත්‍රාවේ ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇත්තේ කල්පිටිය - වන්නි මුන්දලමේ පදිංචි වයස අවුරුදු 37 සහ 42 වියේ පසුවන දෙදෙනෙකි.

රත්‍රං තොගය ඉන්දියාවට රැගෙන යමින් තිබූ බව සැකකරුවන් පවසා ඇත.

තමබාරයටගත්රත්‍රංතොගයද,අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනාවද කටුනායක පිහිටි රේගු නිවාරණ කාර්යාලයට බාර දීමට නාවුක හමුද නිලධාරීන් කටයුතු කර ඇත.

## මාදොල ගම්මුන්ගේ විරෝධයෙන්:

# හොර ස්පා 6ක් වැසේ

### පර්මිට් දුන්නෙ අවිස්සාවේල්ල හිටපු සභාපතිලු



■ චාමර පල්ලේගෙදර

අවිස්සාවේල්ල මාදෙල ප්‍රදේශයේ වසර 6කට අධික කාලයක් තිස්සේ ප්‍රාදේශීය දේශපාලඥයන්ගේ මැදිහත්වීමෙන් නීති විරෝධී ලෙස පවත්වාගෙන ගිය සම්බාහන මධ්‍යස්ථාන 6ක් වසා දැමීමට ප්‍රදේශවාසින් කටයුතු කර තිබේ.

මෙම මාදෙල ප්‍රදේශය කුඩා ගමක් වන අතර එම වපසරිය තුළ පමණක් මෙලෙස නීති විරෝධී සම්බාහන මධ්‍යස්ථාන 6ක් පවත්වාගෙන ගොස් තිබුණි.

දිනෙන් දින එම ගම්මානයේ සම්බාහන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමත් සමග ප්‍රදේශවාසීන් ඊට එරෙහිව විරෝධතා ඇතුළු විවිධ ක්‍රියාමාර්ග ගත් බව ප්‍රදේශවාසීහු පවසති.

මෙම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය ඇතැම් ගොඩනැගිලි අවිස්සාවේල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරියගේ පියාට අයත් වන බවද පැවසේ.

නීති විරෝධී ලෙස පවත්වාගෙන ගිය මෙම සම්බාහන මධ්‍යස්ථාන 6 සඳහාම බලපත්‍ර ලබා දී ඇත්තේ අවිස්සාවේල්ල ප්‍රාදේශීය සභාවේ අවසන් වරට කටයුතු කළ සභාපතිවරයා බවද ප්‍රදේශවාසීහු පවසති.

මේ අතර පසුගිය ජුනි මස 18 වැනිද එම ප්‍රදේශයේ තවත් සම්බාහන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සූදනම් වන අවස්ථාවේදී ප්‍රදේශවාසීන් එක්ව ඊට විරුද්ධව ගම වටා පෙළපාලි ගොස් දැඩි විරෝධතාවයක් පවත්වා එම සම්බාහන මධ්‍යස්ථාන ආරම්භ කිරීම නතර කර තිබුණි.

# ධාතූන් වහන්සේලා රැගත් තායිලන්ත රාජකීය බෞද්ධ දූත පිරිසක් ලංකාවට



තායිලන්ත දූත පිරිස පිළිගනිමින්

■ ටී.කේ.ජී.කපිල - කටුනායක

තායිලන්තයේ සංඝරාජ සොම්දත් යනසම්වරා ( Somdet Yanasamvara - Supreme Patriarch of Thai Sanga ) මාහිමිපාණන් වහන්සේගේ 96 වැනි උපන් දිනය සමරමින් , බුදුන් වහන්සේගේ ධාතූන් වහන්සේලා රැගත් , 98 දෙනෙකුගෙන් සමන්විත රාජකීය බෞද්ධ දූත පිරිසක් ඊයේ(13) දින උදෑසන කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණියහ .

තායිලන්තයේ බැංකොක් නුවර බෞද්ධ පිරිසකගේ දයකත්වයෙන් නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ ඉදිකර ඇති , බුරුමයේ " ස්වේදගොං " චෛත්‍යයේ අනුරූ චෛත්‍ය වන සියම් ශ්‍රී ලංකා වචිර සුවන්නපුම්( Siyam Sri Lanka Vachira Suwannaphum ) චෛත්‍යය විවෘත කිරීමේ උත්සවය හෙට (15) දිනට යෙදී ඇති අතර , එම උත්සවයට සහභාගී වීමට මෙම බෞද්ධ දූත පිරිස පැමිණ තිබුණි

ඊට අමතරව කුරගල රජ මහා විහාරස්ථානයේ තැන්පත් කිරීම සඳහා බුදුන් වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේලාද මෙසේ රැගෙන විත් තිබුණි .

මෙම රාජකීය බෞද්ධ දූත පිරිස ඊයේ(13) උදෑසන 10.40 ට තායිලන්තයේ බැංකොක් නුවර සිට ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ යූ.එල්.- 403 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබුණි.

මෙම ධාතූන් වහන්සේලා රැගත් රාජකීය බෞද්ධ දූත පිරිස කටුනායක ගුවන් තොටුපොළ විශේෂ අමුත්තන්ගේ මැදිරිය වෙත කැඳවා විශේෂ පිළිගැනීමක් සිදු කළ අතර , එසේ රැගෙන ආ ධාතූන් වහන්සේලා වැඳ පුද ගැනීමට කටුනායක ගුවන් තොටුපොළ කාර්යය මණ්ඩලයට විශේෂ අවස්ථාවක් ද ලබා දී තිබුණි .

රාජකීය බෞද්ධ දූත පිරිස පිළිගැනීම සඳහා ශ්‍රී ලංකාවේ තායිලන්ත තානාපති පොජ් හම්පොල් (Poj Hampol) සීමාසහිත ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා සමාගමේ සභාපති විශ්‍රාමික මේජර් ජනරාල් ජී.ඒ.චන්ද්‍රසිරි ඇතුළු ගිහි පැවිදි විශාල සම්භාවනීය පිරිසක් කටුනායක ගුවන් තොටුපොළ විශේෂ අමුත්තන්ගේ මැදිරිය වෙත පැමිණ සිටියහ .

මෙසේ පැමිණි රාජකීය බෞද්ධ දූත පිරිස මෙම උත්සව වලින් පසුව අනුරාධපුරය , මහනුවර ශ්‍රී දළඳ මාළිගාව ,කැලණිය රජ මහා විහාරස්ථානය ආදිය නැරඹීමට යාමටද නියමිතය .


## රන් භාණ්ඩ වෙන්දේසියේ විකිණීමයි

[illegible] 2023/04/12 [illegible] 30 [illegible] 85 [illegible]

| උකස් සම්බන්ධ ශාඛාව | වෙන්දේසි දිනය හා වේලාව | වෙන්දේසි ස්ථානය |
|---|---|---|
| [illegible] | 26 ජූලි පෙ.ව. 10.00 | අංක 344, ගාලු පාර, කොළඹ 04 |
| [illegible] | 26 ජූලි පෙ.ව. 10.00 | අංක 101, [illegible] |
| [illegible] | 27 ජූලි පෙ.ව. 10.00 | අංක 58/22B, [illegible] පාර, [illegible] |
| [illegible], ගාල්ල, මාතර | 27 ජූලි පෙ.ව. 10.00 | අංක 79, [illegible], මාතර |
| [illegible] | 27 ජූලි පෙ.ව. 10.00 | අංක 187, [illegible] පාර, [illegible] |
| [illegible] | 28 ජූලි පෙ.ව. 10.00 | අංක 30, [illegible] |
| [illegible] | 28 ජූලි පෙ.ව. 10.00 | අංක 141/1 [illegible] |

[illegible] රු. 5000 [illegible]

ASIA ASSET FINANCE PLC

සහකාර සාමාන්‍යාධිකාරී (රන් ණය)

[illegible] 76, [illegible] කොළඹ 02.

[illegible] 0767 888 222 [illegible] 0117 699 000

[illegible] PB139







# කැමරා ඇස

2023 ජුලි 14 සිකුරාදා

ඡායාරූප ලලිත් පෙරේරා - ප්‍රදීප් දඹරගේ

## මෙතන පොඩ්ඩක් ඉඳලම යමු



ගොල්ෆේස් පිටියේ පැවැති හමුදා පෙරහුරුවකට එක්වූ නිලධාරීන් විවේකයක් ලද අවස්ථාවේ කාලතුවක්කුවක් අසල විඩාහරිමින්.

## ගල්කිස්සේ කුණු කඳු ගැසේ



වාරකන් කාලයේදී ගල්කිස්ස මුහුදු වෙරළට ගොඩ ගසන කුණු එකතු කරන කාන්තාවක්

## නැගිටින්න වාරු දෙන්න



නවීකරණය කළ අනුරාධපුර ඕමන්ත දුම්රිය ගමනාගමනය විවෘත කිරීමේ අවස්ථාට එක්වූ ප්‍රවාහන ඇමැති බන්දුල ගුණවර්ධන.

## දැක්කත් ඇති හිත පිරෙනවා...



කෘෂිකර්ම අමාත්‍යාංශයේ මඟ පෙන්වීමෙන් “සෝජාන්” ක්‍රමයට කොළඹදී වගා කළ වැටකොළු වගාවක්

## මෙහෙම පීනද්දී අපි ලස්සනයි ද?



හලාවත මුහුදේ ඩෝල්ෆින් රංචුවක් පිහිනා යන ආකාරය

---

## එතෙර අරුණ

# ලෝක ජනගහණයෙන් අඩක් ඉන්නේ ණය බරින් මිරිකුන රටවල



### සංවර්ධනය වෙමින් පවතින රටවල ණය ප්‍රතිව්‍යුහගත කිරීම වඩාත් දුෂ්කර වෙලා

### රටවල් 52ක ණය අතිශය දරුණු මට්ටමකට

### අත්‍යවශ්‍ය වියදම්වලටත් වඩා පොලී ගෙවනවා

නිහාල් පීරිස්

ලෝක ජනගහණයෙන් බිලියන 3.3කට ආසන්න සංඛ්‍යාවක්, එනම් ලෝක ජනගහණයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් ජීවත් වන්නේ දැවැන්ත ණය අර්බුදවල සිර වී සිටින රටවල බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසයි. සෞඛ්‍යය, අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවා වෙනුවෙන් වියදම් කරනවාට වඩා වැඩි මුදලක් තමන් ගත් ණයවලට පොලී ලෙස ගෙවන්නට මෙම රටවලට සිදුව ඇති බව එම සංවිධානය තව දුරටත් පෙන්වා දෙයි. මෙම තොරතුරු සඳහන් වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය නිකුත් කරන ලද අලුත්ම වාර්තාවකය.

‘අපේ ලෝකයෙන් අඩක් බිහිසුණු ණය අර්බුදයක් විසින් ජනිත කරන ලද ඉතා දරුණු සංවර්ධන ඛේදවාචකයක ගිලෙමින් සිටිනවා’ මෙම වාර්තාව නිකුත් කළ අවස්ථාවේ මාධ්‍ය හමුව අමතමින් එසේ පවසා තිබුණේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් අන්තෝනියෝ ගුතරේස්ය. ඉහත කී වාර්තාව නම් කර ඇත්තේ ‘ණයෙන් සැදි ලෝකයක්’ යනුවෙනි.

මෙම වාර්තාවට අනුව පසුගිය වසර වනවිට ගෝලීය රාජ්‍ය ණය ප්‍රමාණය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 92ක් දක්වා වැඩි වී තිබේ. මෙය 2000 වසරේ පැවැති ගෝලීය රාජ්‍ය ණය ප්‍රමාණයට වඩා පස් ගුණයක වැඩි වීමක් බව වාර්තාව පෙන්වා දෙයි. එය ඉතා දරුණු තත්ත්වයකි. මෙම රාජ්‍ය ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක බර දරන්නේ සංවර්ධනය වෙමින් සිටින රටවල්ය. අධික ණය බරෙන් පීඩා විඳින රටවල් සංඛ්‍යාව 2011 වසරේ පැවතුණේ 22ක් ලෙසිනි. නමුත් එය 2022 වනවිට 59ක් දක්වා ඉහළ ගොස් තිබේ.

මේ අතරින් රටවල් 52ක ණය අර්බුද අතිශයින් දරුණු මට්ටමකට ළඟා වී ඇති බව ‘ණයෙන් සැදි ලෝකයක්’ වාර්තාව සඳහන් කරයි. සංවර්ධනය වෙමින් පවතින රටවල් සංඛ්‍යාවෙන් සියයට 40ක් පමණ මීට අයත් වේ. මෙම රටවලින් බහුතරය ඔවුන්ගේ රටවල අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි කටයුතු සඳහා වැය කරනවාට වඩා වැඩි මුදලක් ණය පොලී ගෙවීම සඳහා වැය කරයි. අප්‍රිකාව, ආසියාව, ලතින් ඇමරිකාව වැනි කලාපවල රටවල් මෙයට අයත් වේ.

මෙම රටවල් ගෙන ඇති ණයවලින් විශාල ප්‍රමාණයක් ලබාගෙන ඇත්තේ පෞද්ගලික ණය හිමියන්ගෙන් බවත්, ඒ නිසා ඉතා ඉහළ පොලී ගෙවන්නට සිදුව ඇති බවත් අන්තෝනියෝ ගුතරේස් පෙන්වා දෙයි. මෙය මෙම රටවල ණය පීඩනය තීව්‍ර කිරීමට බෙහෙවින් දායක වී ඇති කාරණයකි. මේ වනවිට අප්‍රිකාවේ රටවල් ණය පොලී ලෙස ගෙවන ප්‍රමාණය ඇමරිකාව ගෙවන ප්‍රමාණය මෙන් සිව් ගුණයක් බවත් යුරෝපයේ දියුණු රටවල් ගෙවන ප්‍රමාණය මෙන් අට ගුණයක් බවත් මහලේකම්වරයා පවසයි.



එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වෙළෙඳ සහ සංවර්ධන අංශයේ ප්‍රධානී රෙබෙකා ග්‍රයින්ස්පෑන් පවසන ආකාරයට සංවර්ධනය වෙමින් පවතින රටවල ණය සංයුතියේද වෙනස්කම් රැසක් සිදුව තිබේ. 2010 වසර වනවිට එම රටවල සමස්ත විදේශීය ණය ප්‍රමාණයෙන් පෞද්ගලික ණය හිමියන්ගේ ණය තිබුණේ සියයට 47ක් පමණි. නමුත් 2021 වනවිට මෙම ප්‍රතිශතය සියයට 62ක් දක්වා වැඩි වී ඇති බව ඇය සඳහන් කරයි. මෙම ණය ලබා දෙන්නේ අදාළ රටවලට එතරම් වාසිදායක කොන්දේසි යටතේ නොවන බවද, ඒ නිසා එම ණය ප්‍රතිව්‍යුහගත කිරීම වැනි කාරණා වඩා දුෂ්කර වී ඇති බවද ග්‍රයින්ස්පෑන් තව දුරටත් පෙන්වා දෙයි.

ඉහත කී රටවල් මෑත කාලයේ මෙවැනි ණය අර්බුදයක සිරවීමට ප්‍රධාන කාරණා දෙකක් බලපා ඇති බව එක්සත් ජාතීන්ගේ වාර්තාව පෙන්වා දී තිබේ. එකක් නම් කොවිඩ් වසංගතය, ජීවන වියදම ඉහළ යෑම සහ දේශගුණික විපර්යාස ආදිය විසින් ඇති කරන ලද ගැටලු ජය ගැනීම සඳහා විශාල වශයෙන් මුදල් වැය කිරීමට සිදු වීමයි. අනෙක් කාරණය නම් ලෝක මූල්‍ය ක්‍රමයේ පවතින විෂමතාය. මේ නිසා සංවර්ධනය වෙමින් තිබෙන රටවලට මුදල් සපයා ගැනීම බෙහෙවින් දුෂ්කර වී ඇති බවත්, ඒ සඳහා දැරිය යුතු පොලී වැනි වියදම් අධික වී ඇති බවත් වාර්තාව අවධාරණය කරයි. වත්මන් ලෝක මූල්‍ය ක්‍රමය යනු එය බිහි වූ කාලයේ පැවැති යටත් විජිතවාදී බල යාන්ත්‍රණයන් ගැබ් කරගත් මේ වනවිට කල් ඉකුත් වී ඇති ක්‍රමයක් බවටත්, ඒ තුළ බොහෝ විෂමතා පවතින බවටත් ගුතරේස් චෝදනා කර තිබේ.

2010 සහ 2022 කාලය අතරතුර ආසියා පැසිෆික් රටවල රාජ්‍ය ණය සිව් ගුණයකින් ඉහළ ගොස් ඇති බව සඳහන් වේ. අප්‍රිකානු කලාපයේ රටවල ණය එම කාලය තුළ තුන් ගුණයකින් ඉහළ ගොස් තිබේ.



